# 2013 – 05 – 07 වන දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පැවති මාසික සභා රැස්වීම් වාර්තාව

**සහභාගීත්වය :-**

| | | |
|---|---|---|
| **01.** | එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 02. | කමල් වැල්ලගේ මහතා | ගරු උප සභාපති |
| **03.** | ඒ. පී. ලක්ෂ්මි හේමන්තා සිල්වා මෙනවිය | ගරු නගර සභා මන්ත්‍රී |
| **04.** | එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **05.** | එච්. එල්. අනුර කිත්සිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| 06. | පී. සරත් ශ්‍රීලාල් මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **07.** | ශ්‍රේෂන් කෙරම්ණියගේ මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **08.** | ඒ. ඩබ්. ජගත් කුමාර මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **09.** | ජේ. ඩබ්. ජයන්ත මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **10.** | ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **11.** | කේ. එම්. චන්ද්‍රසිරි මහතා | ගරු නගර සභා මන්ත්‍රී |
| **12.** | බී. ජනිත් වික්‍රමතිලක මහතා | ගරු නගර සභා මන්ත්‍රී |

☸ පන්සිල් සමාදන් වීමෙන් අනතුරුව පෙ. ව. **09.30** ට රැස්වීමේ වැඩ කටයුතු ආරම්භ කරන ලදී. ☸

## (01)

### 01:01 2013 – 04 – 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම

2013 – 04 – 02 දින පවත්වන ලද මාසික සභා රැස්වීම් වාර්තාව පිළිගත යුතු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

✠ **ඒ අනුව 2013 - 04 – 02 දින පවත්වන ලද මාසික සභා වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

## (02) සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන    නැත

## (03) ලැබී ඇති පැමිණිලි පෙත්සම් හා ලිපි සභාවට ඉදිරිපත් කිරීම

**3:1** " 2013 වර්ෂය සඳහා අනුමත මිල ගණන් - වාරි මාර්ග " මැයෙන් දකුණු පළාත් පළාත් පාලන සහකාර කොමසාරිස්තුමා විසින් එවා තිබූ ලිපිය සභාගත සභාගත කිරීම.

දකුණු පළාත් පාලන දෙපාර්තමේන්තුවේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා අනුමත මිල ගණන් (වාරා මාර්ග) ඉදිරිපත් කර තිබුණි

__තීරණය__

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**3:2** " පරිගණක දත්ත ක්‍රියාකරුවෙක් ලබා ගැනීම සඳහා " මැයෙන් අම්බලන්ගොඩ නගර සභාවේ මහජන පුස්තකාලයේ පුස්තකාලයාධිපතිනිය විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

ඉදිරියේදී පුස්තකාල සේවාවන් පරිගණක ගත කිරීමට අදහස් කර ඇති බැවින් ඒ සඳහා සුදුසුකම් ලත් නිලධාරියෙකු පුස්තකාලයට ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

__තීරණය__

☞ **අම්බලන්ගොඩ මහජන පුස්තකාලය සඳහා පරිගණක දැනුම ඇති සුදුසුකම් සහිත අයෙකු තාවකාලිකව බඳවා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී .**

**3:3** " වෙසක් තොරණ සඳහා අවසර ලබා ගැනීම " මැයෙන් 2013. 04. 29 දාතමින් සී ඩ්‍රගන්ස් බෞද්ධ සමිතියේ විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

සී ඩ්‍රගන්ස් බෞද්ධ සමිතිය මගින් 21 වන වරටත් සංවිධානය කරන වෙසක් තොරණ 2013 මැයි මස 24 සිට 29 දක්වා අම්බලන්ගොඩ තානායම අසලදී ප්‍රදර්ශනය කරනු ලබන බවත් ඊට සමගාමීව මුචලින්ද නාගදරණය සහ මැජික් සංදර්ශන ප්‍රද්ර්ශනයක්ද පැවැත්වෙන බවත් එය විනෝද බදු වලින් නිදහස් කර දෙන ලෙසත් මැජික් සංදර්ශනය අම්බලන්ගොඩ තානායම් භූමිය තුල ප්‍රදර්ශනය කිරීමට අවසර ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේකෙ ගියපාර පාර කඩන කොට එගොල්ලො පොරොන්දු වුනා පාර කඩන තැන් වහල දෙනවයි කියලා. නමුත් මේ ලියුම ඉදිරිපත් කරන තුරුත් මේව වහල නෑ. එගොල්ලන්ගෙ පොතක තිබුන අපේ පාරෙ තමයි මේ තොරණෙ 90% ක්ම තිබුනෙ නමුත් ස්තුති කරල තිබුනෙ මාර්ග සංවර්ධන අධිකාරියට. විනෝද බදු නිදහස් කිරීම සම්බන්ධයෙන් නගර සභාවට ස්තුති කරල තිබුණ. .

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්ලිව්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි බෞද්ධාගමික කටයුත්තක් නිසා අඩුම මුදලක් අය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මෙහෙම දෙයක් කරන එකත් ලොකු දෙයක්. ඒ අය මේව වහපු නැති එකත් වරදක් තමයි. ඒනිසා ඒඅ යට මේ වරද පෙන්නල දෙන්න.

<u>තීරණය</u>

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව මැජික් සංදර්ශනය සඳහා තානායම් භූමිය ලබා දීමටත් මැජික් සංදර්ශනය සහ මුචලින්ද නාගදරණය ප්‍රදර්ශනය සඳහා අය කරනු ලබන ගාස්තු විනෝද බදු වලින් නිදහස් කිරීමටත් පලුදු කිරීම් කරනු ලබන මාර්ගය ප්‍රතිසංස්කරණය සඳහා වන ගාස්තු අය කර ගැනීමටත් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**3:4** “ අම්බලන්ගොඩ නගරය ” මැයෙන් ජේ. අයි ද සිල්වා මහතා විසින් එවන ලද නගර වැසියන් විසිහත් දෙනෙකුගේ අත්සනින් යුතුව එවන ලද ලිපිය සභාගත කරන ලදී.

අම්බලන්ගොඩ නගරයේ පැරණි ගොඩනැගිලි ඉදි කර ඇත්තේ සැලැස්මකට අනුව බවත් නාගරික සංවර්ධන අධිකාරියට පවරා ගැනීමෙන් පසු සැලැස්ම අමතක කර ගොඩනැගිලි ඉදි කරනු ලබන බවත් අම්බලන්ගොඩ නගරයේ වෙරළට සමාන්තරව මාර්ග තුනක්ම පිහිටා ඇති බවත් කොළඹ හම්බන්තොට මාර්ගය උතුරු මායිමේ සිට ඇල්පිටිය මාර්ගය පටන් ගන්නා ස්ථානය දක්වා දක්වා අඩි 100 ක් ලෙසද එතැන් සිට දකුණු මායිම දක්වා ඇති මාර්ගයෙහි අඩි 60 ක් වන සේද වීථි රේඛා සටහන් කිරීමට කටයුතු කරන ලෙස ඉල්ලා තිබුණි.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වීථි රේඛා ලකුණු කිරීමේ බලයක් සභාවට නැහැ. පාර්ලිමේන්තු පනතකින් පනවල තියෙනව ගාලු පාරත් අලුත් පාරත් දෙකම අඩි 100 වන සේ ගොඩනැගිලි සීමාවන් දක්වන්න කියලා. ඒ අනුව දැනට කරන් ලබන ඉදිකිරීම් වලට පාර මධ්‍යයේ සිට අඩි 50 බැගින් අඩි 100 වනසේ තමයි ලකුණු කිරීම් කරන්නෙ. මෙහිදී අපි බලන්න ඕනෙ නගරය මැදින් අඩි 100 ගානෙ පාරවල් දෙකක් ගියොත් අඩි 200 ක් නගරය මැදින් අයින් වෙනවා. අපි කියන්න ඕනෙ මාර්ග සංවර්ධන අධිකාරියට පරණ ගාලු පාර මේ අඩි 100 න් ඉවත් කරන්න කියලා. අලුත් පාර අඩි 100 ට පවත්වා ගැනීම වඩා සුදුසුයි මා හිතන ආකාරයට. අපි නගරයේ වැසියන්ට හිරිහැරයක් නොවන සේ යෝජනා කිරීම අපේ යුතුකමක්. මේ පිළිබඳව සාකච්ඡා කරන්නෙ පාර්ලිමේන්තුවේ මාර්ග සංවර්ධනය පිළිබඳ තේරීම් කාරක සභාවේදි. අම්බන්ගොඩ නගරය

සම්බන්ධව කතා කරන්න සෑම විටම පාර්ලිමේන්තු නියෝජනයක් නැති වෙලා තියෙනවා. ඒක තමයි අපට තියෙන අවාසිදායක තත්වය. එනිසා අපි සභාව වශයෙන් මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපේ නගරයට අවශ්‍යතාවක් වන ගාලු පාර අඩි 100 දක්වා පුලුල් කිරීම සිදු කිරීමට නොහැකි වෙලා තියෙනවා. සියලු දෙනාගේම හිත් හොඳ වෙන දියට මේක කරන්න ගියොත් අම්බලන්ගොඩ නගරයේ අනාගත සංවර්ධනය සීමා විමක් වෙනව සභාපතිතුමනි. ව්‍යාපාරිකයන් අපේ නගරය තුලම රඳවගෙන ඉදිරි පරම්පරාවට නගරය සංවර්ධනය කර දිය යුතුයි. අපි ඉල්ලා සිටින්නෙ අඩි 60 ක් නෙමෙයි අඩි 30 ක් තියන්න කියල. අපට තව කාලෙකින් හිතේවි අඩි 100 ත් මදියි කියලා. හොඳම උදාහරණය තමයි ගාල්ල නගරය. අපිත් හිතුව කුඩා ව්‍යාපාර අතුගෑලා යයි කියල. නමුත් වුනේ ඇත්තටම ගාල්ල නගරය ප්‍රතිනිර්මාණය වීමක්. අපි සමීක්ෂණයක් කරා සභාපතිතුමනි. ගාල්ලෙ ව්‍යාපාරික මහත්වරු කියනව එදාට වඩා ව්‍යාපාර තත්වයන් දියුණු වෙලා තියෙනවා කියලා. අද වන විට කරන්දෙනිය බද්දේගම වැනි ප්‍රදේශ දියුණු වෙලා තියෙනවා. අපි මේ ගාලු පාර පුලුල් නොකරොත් ඒක අපේ ආර්ථිකයට බලපානව. සංස්කෘතියට බලපානව. මෙහිදී අපි අම්බලන්ගොඩ නගරයේ පුරවැසියන් හැටියට පෙල ගැහෙමු කියල ඉල්ලා සිටිනව සභාපතිතුමනි. මේදේ අපේ නගරයේ අධ්‍යාපනයටත් බලපානව. මේ කිලෝමීටර් එකහමාර දෙක පහු කරන්න විනාඩි විස්සක් විතර යනවා. අම්බලන්ගොඩ නගරයට දවසකට පිවිසෙන ප්‍රජාව 40000 කට වැඩි වුනා 1994 දි. දැන් වෙන කොට ලක්ෂයක් පනිනවා ඇති. මිනිස්සුන්ගෙ කාලය ඉතාම වටිනවා. රට ඉදිරියට යන වෙලාවෙ මේ දේවල් ගැන අපි අවධානය යොමු කරන්න ඕනෙ. මේ සම්බන්ධයෙන් අපේ ප්‍රධාන අමාත්‍යතුමා දැනුවත් කරල පක්ෂ විපක්ෂ සියලුම මන්ත්‍රීවරුන් දැනුවත් වෙලා නාගරික සංවර්ධන අධිකාරිය භාරව සිටින ආරක්ෂක අමාත්‍යතුමා දැනුවත් කරල මේ සම්බන්ධයෙන් කතිකාවතක් සූදානම් කරන්න කියල මම ඉල්ලීමක් කරනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මේක අපිට කරන්න බැහැ. පාර්ලිමේන්තුවේ තේරීම් කාරක සභා වලින් තමයි කෙරිය යුත්තේ. මෙය කල යුත්තේ මන්ත්‍රීවරයෙකු මගින් නම් මම ඔබ තුමාගෙන් ඉල්ලා සිටිනවා අපේ නගරයේම පදිංචිව සිටිනවා සජින් වාස් ගුණවර්ධන මහත්මය. මම හිතනව එතුමාට මේ ඉල්ලීම ලබා දීල ඒක පාර්ලිමේන්තු තේරීම් කාරක සභාවට ඇතුල් කරන්න සැලැස්සුවොත් අපේ මේ බලාපොරොත්තුව ඉෂ්ඨ කර ගන්න පුලුවන්. ඒක නගර සබාව වෙනුවෙන් ඕනෑම මන්ත්‍රීවරයෙකුට කරන්න පුලුවන්. මම එදා දක්වපු අදහසම තමයි අදත් දක්වනනෙ. කෙරිය යුත්තෙ තේරීම් කාරක සභාවට ගොස් අපට තියෙන අඩුපාඩු පෙන්නල මිනින්දෝරු සැලැසැමක් සකස් කරල එතකොට අපට දත්ත ඇතුව මේක පෙන්වන්න පුලුවන්. මේක කතා කරාට අවබෝධයක් වෙන්නෙ නැහැ. සැලැස්මෙන්ම පෙන්නන්න ඕනෙ. ඔබතුමා එතනට කැඳෙවුවොත් වඩා හොඳයි. එහිදී අපිට පෙන්නන්න පුලුවන් මේ පාරවල් දෙකෙන් අපිට කොපමණ ඉඩ ප්‍රමාණයක් නාස්ති වෙනවද කියන එක. අපි පක්ෂ විපක්ෂ භේදයක් නැහැ. අපපේ නගරයට හානියක් වෙනව නම් අපි ඒ දේදි එකතු වෙනවා. අපි මේ රැස්වීමේ කොච්චර කතා කරත් මේක වෙන්නෙ නැහැ. යායුත්තේ තේරීම් කාරක සභාවට පමණයි. මේකට නගර සභාවෙන් මුදලක් වියදම් වුනත් කමක් නැහැ. මම ඉල්ලා සිටිනවා මේදේ ඒ විදියට සිදු කරන ලෙස.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මම හිතන්නෙ හොඳ අදහසක් ජයන්ත මහත්මය ඉදිරිපත් කරේ. අවශ්‍යතාවය තිබුණ වගේම ඒක අදාල ආයතන වලට පෙන්නල දෙන්න ඕනෙ. මට දැනගන්න ඕනෙ සභාපතිතුමනි මේ නගරයේ තියෙන පාරවල් ඉඩම් ඒ සියල්ල සම්බන්ධව සැලසුමක් නැද්ද. ඔබතුමා මේකට උත්සාහ අරගෙන කරන්න කියල අපි ඉල්ලා සිටිනවා.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

තියෙනවා. නවීන ක්‍රමවේදයන්ට අනුවයි පැරණි ක්‍රමවේදයන්ට අනුවයි දෙකෙන්ම තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ගාලු පාර සම්බන්ධයෙන් තීරණ ගැනීමේදී වැදගත් තීරණයක් අපිට ගන්න වෙනවා. අම්බලන්ගොඩ නගරයේ උත්සව කාල වලදී මෙන්ම දිනපතාම පාසල් වේලාවන් තුලදී සෑහෙන තදබදයක් ඇතිවෙනවා. පසුගිය දිනවල තිබුණ වැඩ මුලුව තුලත් මේ සමබන්ධව දීර්ඝ වශයෙන්ම ඔබතුමා කරුණු ඉදිරිපත් කරල සාකච්ඡා කරා. මේ නගරයේ තියෙන සමහර ඉඩම් නගරෙට වැදගත් නොවන ආකාරයට තමයි තවමත් පවතින්නෙ. වාරිමාර්ග දෙපාර්තමේන්තුව පවතින ඉඩම ඉන් එකක්. ඔබතුමාගෙ අදහසක් තියෙනවා අපෙත් අදහසක් තියෙනව රාජ්‍ය ආයතන සියල්ල එතනට ඒකාබද්ද කරල එතන සංවර්ධනය කරන්න. අපි විපක්ෂයේ හිටියත් නගරයේ සංවර්ධනය කාටත් පොදුයි. අඩි 100 ට මේ ගාලු පාර පළල් වෙන්න ඕනෙ. එහිදී වෙළෙන්දන්ට යම් දෙයක් අහිමි වෙනව නම් ඒ අයට ස්ථාන ලබා දිය යුතුයි. අපි සෘජුව ඉන්නව පාර පුලුල් කර යුතුයි කියන මතේ. මේ සම්බන්ධව දේශපාලන සහයෝගය අරගෙන මේ කටයුත්ත කරන්න හොඳම කාලය තමයි මේ කාලය. අපිත් මේ කටයුත්තට ඔබතුමන්ලාට සහයෝගය දෙන්නෙ තව අවුරුදු 50 ක් 100 ක් ගැන හිතල. මේ පිලිබඳව ඔබතුමන්ලා ඉදිරි කටයුතු කරන්න කියන ඉල්ලීම කරමින් නිහඬ වෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

ගරු සභාපතිතුමනි මන්ත්‍රීවරුනි මාධ්‍යවේදී මහතුනි මෙම ලිපිය අනුව අපි දකිනවා නගරය පාලනය කරන අය විදියට සෑම ආයතනයකටම එම ආයතනය සම්බන්ධව ඉදිරි සැලසුම් තියෙනවා. මෙහි මහජනතාවට චිරාත් කාලයක් වැඩි පහසුකම් ලැබෙන විදියට සුව පහසුව සකස් කිරීම අපේ යුතුකම වෙනවා. ඒකෙ මූලික වගකීම ඉටු කරන්නෙ නාගරික සංවර්ධන අධිකාරිය. ඔවුන් දස අවුරුදු සැලසුම් සභාවට ඉදිරිපත් කරල තියෙනවා. අලුත් පාර අඩි 100ට පළල් කිරීමත් මුහුදු වෙරළ පාර අඩි 60 ක් හෝ 80 ක් දක්වා පළල් කිරීමත් යන කාරණා. ඒ සැලසුම් වගට අනුව අපි කොහොමත් කටයුතු කල යුතුව තිබෙනවා. ඒ කාල වලදි ඉඳපු සභාවල් ඒවට අනුමැතිය දීල තියෙනව අදටත් ඒව ප්‍රායෝගිකයි. ඒව තීන්දු කරාට පස්සෙ වෙනස් වීම් වෙන්නෙ කලාතුරකින්. අලුත් පාර පළල් කිරීමේ වුවමනාව අපට එන්නෙ කලපහුගිය කාලවල අම්බලන්ගොඩ නගරය පහු කරන්න වාහනයකට විනාඩි විස්සක් පැය භාගයක් පමණ ගත වුනා. එතනින් තමයි මේ යෝජනාව පටන් ගන්නෙ. ඒ ආ ගමන මේක හදිසි වෙලා අපි යෝජනා කරා අලුත් පාර අඩි 100 ට පළල් කරන්න. නමුත් හදිසි යෝජනාවක් විදියට රජයට වුවමනාව තිබුන මුහුදු වෙරළ පාර තමයි පළල් කිරීම තමයි ඉතාම අඩු වියදමකින් කරන්න පුලුවන් කියන තැනට ඒ නිලධාරීන් එන්න ඇති.. මෙතන දේශපාලන අධිකාරියේ සම්පූර්ණ එකගතාවය තියෙනවා. දැන් ඒ තත්වය වෙනස් වෙලා. අධිවේගී මාර්ගය විවෘත වීම නිසා දැන් ඒ තදබදය නැහැ. මෙම ව්‍යාපෘතිය මම දකින්නෙ ඉතා විශාල ව්‍යාපෘතියක් විදියට. මේකෙ වන්දි ගෙවීම සරල කාරණාවක් නෙමෙයි. මේකෙ අඩි 100 පාර්ලිමේන්තු පනතෙන් සම්මත වෙලා තියෙන්නෙ. අතීතයේදී උප සභාපතිවරයෙකුව සිටි විල්ෆ්‍රඩ් ද සිල්වා මැතිතුමා ඕක අඩි 60 ට සංකෝචනය කරල මේ සභාවෙ අනුමත කරගෙන එතුමගෙ කඩේ බේර ගත්ත. අදටත් අඩි 60 සීමාවෙදි අපි මේ සියලුම ගොඩනැගිලි වලට අනුමැතිය දීල අද විශාල ප්‍රශ්නයක් වෙලා තියෙනවා ආර්. ඩී. එක අපෙන් අහනව කවුද මේවට වන්දි ගෙවන්නෙ. ඒකට උත්තර නැහැ. ඒ වරදම අපි ඉදිරියටත් කරනවද. කොහෙන්ද මේ අඩි 60 සීමාවට අනුමැතිය ගන්නෙ. මොන ආතතයෙන්වත් දෙන්නෑ. පාර්ලිමේන්තු පනතකින් අනුමත වෙච්ච ගැසට් එකක් අනු නීතියකින් වෙනස් කරන්නෙ කොහොමද. කඩ හිමියන්ගෙ ඉල්ලීම් වල සත්‍යතාවක් තියෙනව. ඒකට ගත යුතු ක්‍රියාමාර්ග සභාපතිතුමා දක්වල තියෙනවා. අද ගාල්ල මාතර නගර විදියට දිස් වෙනවා. අම්බලන්ගොඩටත් ඒ අයිතිය

තියෙනවා. මේකෙ ප්‍රශ්නෙ තියෙන්නෙ මේකට අපි ප්‍රතිපාදන ගන්නෙ කොහොමද කියන එක. අපි අඩි 100 ට පාර පළල් කරල අහිමි වන වෙළෙන්දන්ට ඔබතුමා සභාවෙ මට්ටමින් අවශ්‍ය කටයුතු කරන්න.

__ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,__

මේ සම්බන්ධව අපි ලබන ප්‍රාදේශීය සම්බන්ධීකරණ කම්ටුවෙදිත් සාකච්ඡා කරනවා. පසුගිය දින පහක පැවති වැඩ මුලුවේදීත් අපි මේ ගැන සාකච්ඡා කරා. අපි සාකච්ඡා කරා අම්බලන්ගොඩ බස් නැවතුම් පොලත් දුම්රිය ස්ථානයත් යන ස්ථාන උඩින් ස්ලැබ් එකක් දාල ඒ තුල නව වෙළඳ සංකීර්ණයක් එවගේම වාහන නැවතුම් ස්ථාන සියලු දෙනාට සැපයිය හැකි මට්ටමින් නව නගරයක් ඉදි කිරීම සඳහා සැළැස්මක් සහ රජයේ කාර්යාල සියල්ලම වාරිමාර්ග ඉඩමට ගෙනිහිල්ල සියලු දෙනාම එකම වහලක් යටට ගෙනිහිල්ල ජනතාවට සේවය කිරීමට ගොඩනැගිල්ලක් ඉදි කිරීමටත් එම හිස් වෙන ස්ථාන නගරයේ පාර්කින් සහ වෙනත් වෙළඳ අගයක් තිබෙන කටයුතු සඳහා යොදා ගැනීමටත්. අපිට බලය නෑ පාර්ලිමේන්තු පනත ඉක්මවල කටයුතු කරන්න. මේ සම්බන්ධයෙන් අපි ඉදිරියටත් කටයුතු කරනවයි කියන බව දන්වනවා.

__තීරණය__

☞ **මේ සම්බන්ධයෙන් සාකච්ඡා කල සභාව අලුත් පාර අඩි 100 දක්වා පුලුල් කිරීමට අදාලව 2013-05-09 දින ප්‍රාදේශීය සම්බන්ධීකරණ කම්ටුවේදී සාකච්ඡා කිරීමටත් මාර්ගය පුලුල් කිරීම සම්බන්ධව ඉදිරි කටයුතු සිදු කිරීමටත් සභාව තීරණය කරන ලදී.**

**3:5** “ නගර ශාලාව නොමිලේ ලබා ගැනීම ” මැයෙන් 2013. 04. 26 දාතමින් ඩී ඒ. පියසීලි මිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

2013- 05- 04 දින පැවැත්වෙන භාවනා වැඩ සටහනක් සඳහා නගර ශාලාව නොමිලේ ලබා දීමට කටයුතු කරන මෙන් ඉල්ලීම් කර තිබුණි.

__තීරණය__

☞ **2013- 05- 04 දින භාවනා වැඩ සටහනක් සඳහා විදුලිය හා ජලය සඳහා පමණක් ගාස්තු අය කර නගර ශාලාව නොමිලයේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(04)** යථා පරිදි කල්දී ඇති ප්‍රශ්ණ නැත

**(05)** යථා පරිදි කල්දී ඇති යෝජනා නැත

## (06) කාරක සභා වාර්තා සලකා බැලීම

**6: 1** **2013- 05- 02** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

### 2013 මැයි මස 02 වැනි දින ප.ව. 2.30 ට පැවැත් වු පුස්තකාල කමිටු වාර්තාව

| | | |
|---|---|---|
| 1. | ඇම්.ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා | ගරු සභාපති |
| 2. | ඩී.වී. සුනිල් මහතා | ලේකම් |
| 3. | ඩබ්.පී. සිල්වා මිය | ප්‍රජා සංවර්ධන නිලධාරිනි |
| 4. | කේ.එච්. මෙලානි මදුෂා මිය | පුස්තකාලයාධිපති |
| 5. | බී.එච්. විමලදාස මහතා | කමිටු සමාජික |
| 6. | සිරිපාල මාදුවගේ මහතා | කමිටු සමාජික |
| 7. | ජිනේන්ද්‍රවංශ ද සිල්වා මහතා | කමිටු සමාජික |
| 8. | ජේ.ඩබ්.ජේ. සිල්වා මහතා | කමිටු සමාජික |
| 9. | ජී.ඩබ්. ගුණසිරි මහතා | කමිටු සමාජික |
| 10. | ඒ.ඩබ්. ඉන්ද්‍රදාස මහතා | පුස්තකාල සහායක |
| 11. | ගෞරී වරුසවිතාන මිය | පුස්තකාල සහායිකා |
| 12. | එම්.ඩබ්.ජේ. සුමංගලී මිය | පුස්තකාල සහායිකා |
| 13. | ජී.එච්.එල්. පියන්ති මෙනවිය | පුස්තකාල සහායිකා |
| 14. | ඩී.එම්.ජී.එස්. දිල්රුක්ෂි මිය | පුස්තකාල සහායිකා |
| 15. | මාලතී සමන්තා ආරියසිංහ මිය | පුස්තකාල සහායිකා |
| 16. | ඒ.ජී. ලක්ෂ්මී පෙරේරා මෙනවිය | පුස්තකාල සහායිකා |

## මූලාසනය

ගරු සභාපතිතුමා ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම සාමාජික මහතුන්, ලේකම් මහතා ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලුම නිලධාරීන් පිළිගැනීමෙන් කමිටුවේ වැඩ ආරම්භ කරන ලදි.

1. පුස්තකාල ප්‍රගති වාර්තාව කමිටුවට ඉදිරිපත් කිරීම.

   ප්‍රධාන පුස්තකාලයේ ප්‍රගති වාර්තාව පුස්තකාලයාධිපති මෙලනි මධුෂා මහත්මිය විසින්ද අනෙකුත් ශාඛා පුස්තකාලවල ප්‍රගති වාර්තා ඒ ඒ ශාඛා භාර නිලධාරීන් විසින් ඉදිරිපත් කරන ලදි. මහ අම්බලන්ගොඩ ශාඛා පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ජී.එච්.එල්. පියන්ති මෙනවිය විසින්ද කෙරමිණිය ශාඛා පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ඒ.ඩබ්ලිව්. ඉන්ද්‍රදාස මහතා විසින්ද, හිරේවත්ත ශාඛා පුස්තකාලයේ ප්‍රගති වාර්තාව ඩී.එම්.ජී.එස්. දිල්රුක්ෂි මහත්මිය විසින් ඉදිරිපත් කරන ලදි.

2. පසුගිය මස කමිටු වාර්තාව ඉංග්‍රීසි බසට පරිවර්තනය කරදීම පිළිබඳව සභාපතිතමා විසින් ජිනේන්ද්‍රවංශ මහතාට ස්තූතිය ප්‍රකාශ කරන ලදි.

3. කමිටු වාර්තාව සැකසීමේදී නිවැරදි ලෙස සැකසිය යුතු බව ජිනේන්ද්‍රවංශ මහතා විසින් පුස්තකාලයේ කාර්ය මණ්ඩලය දැනුවත් කරන ලදි.

4. දැනට ඉදිකරමින් පවතින " E Library" ගොඩනැගිල්ල ඒ සඳහා ගැලපේද යන්න සොයා බලා කඩිනමින් ඒ පිළිබඳව දැනුවත් කරන ලෙස සභාපතිතුමා විසින් පවසන ලදි.

5. පරිගණක ක්‍රියාකාරිනියක් අවශ්‍ය බව පුස්තකාලයාධිපතිනිය විසින් ඉල්ලුම් කර බව ප්‍රකාශ කරන ලදි.

**තීරණය** : එම ලිපිය සභාවට යොමුකර ඇති බව සභාපතිතුමා විසින් පවසන ලදි.

6. කමිටු සාමාජික ජේ.ඩබ්ලිව්.ජේ. සිල්වා මහතා විසින් අවට ප්‍රධාන පාසල් දෙකෙහි විදුහල්පතිවරු දෙපල දැනුවත් කොට එම පාසලේ පරිගණක පිළිබඳ දැනුම ඇති ගුරුවරුන්ගෙන් හා සිසුන්ගෙන් අවශ්‍ය උදව් ලබාගත හැකි බව පවසන ලදි.

7. දීර්ඝ කාලයක් භාවිතයෙන් තොරවු පොත් ස්කෑන් කර සංයුක්ත තැටියකට ලබා ගැනීමෙන් පුස්තකාලයේ ඉඩ පහසුකම්ද ලබා ගැනීමට හැකිවන බව ද සභාපතිතුමා විසින් පවසන ලදි.

8. අප්‍රේල් මාසයට පැවැත්වීමට නියමිතව තිබූ කමිටු රැස්වීම මැයි මස 2 වන දින පැවැත්වුවද නැවතත් මෙම මාසයට අදාළ කමිටු රැස්වීම මෙම මාසයේ අගටද පැවැත්වීමට කටයුතු කරන ලෙස සභාපතිතුමා විසින් පැවසූ අතර සෑම මාසයකදීම පුස්තකාල කමිටුව පැවැත්විය යුතු බවත් කාර්ය සාධනයේදී ලකුණු දීමේදී එය වැදගත් වන බව පවසන ලදි.

9. ''මහජන පුස්තකාල ප්‍රවර්ධන වැඩ සටහන - 2013'' දරණ ලිපියෙහි අන්තර්ගත වූ II ශ්‍රේණියේ දර්ශකවලට ආසන්න වූ III වන ශ්‍රේණියේ මහජන පුස්තකාල III වන ශ්‍රේණිය ලබා ගැනීමට ආසන්න දර්ශක සහිත මහජන පුස්තකාල එම ශ්‍රේණිය වෙත ඉක්මනින් ළඟාකර ගැනීමට මැයි මාසය පුස්තකාල ප්‍රවර්ධන මාසය සේ සලකා අවශ්‍ය කටයුතු කරන ලෙස සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

10. පුස්තකාලයේ පවතින්නා වූ පොත් පරිගණක ගත කිරීම සඳහා මෘදුකාංගයක් අවශ්‍ය බව පුස්තකාලයාධිපතිනිය විසින් පවසන ලදි.

**තීරණය :**

1. ඒ සඳහා අවශ්‍ය මෘදුකාංගයක් ලබා ගැනීමට ලිඛිතව සභාවෙන් අනුමැතිය ගතයුතු බව සභාපතිතුමා විසින් පවසන ලදි.

2. තවද ඒ සඳහා ජාතික පුස්තකාල සේවා මණ්ඩලයේ Winisis මෘදුකාංගය ලබා ගැනීමට හැකිබවද කියා සිටියේය.

11. පුස්තකාල සහායකයින් රාජ්‍ය පරිපාලන හා පුස්තකාල සේවා මණ්ඩලයේ පරිගණක පුහුණුව ලබා දීමට කටයුතු කරන ලෙස සභාපතිතුමා විසින් ප්‍රජා සංවර්ධන නිලධාරිනිය දැනුවත් කරන ලදි.

පුස්තකාලයාධිපතිනියටත්, ප්‍රජා සංවර්ධන නිලධාරිනියට හා පරිගණක දත්ත ක්‍රියාකාරිනි නිලන්ති මහත්මිය සමග සාකච්ඡා කිරීමෙන් පසුව පුස්තකාල සේවා මණ්ඩලයෙන් නොමිලයේ ලබාදෙන මෘදුකාංගය ලබාගැනීම සඳහා පුස්තකාල සේවා මණ්ඩලයට ගොස් අවශ්‍ය කටයුතු කරන ලෙස සභාපතිතුමා විසින් පවසන ලදි.

එහිදී පුස්තකාල සේවා මණ්ඩලයෙන්ම පොත් මෘදුකාංගයට ඇතුලත් කිරීම සඳහා වූ දැනුමද ලබාගත හැකි බව කමිටු සමාජික ජිනේන්ද්‍රවංශ මහතා පවසන ලදි.

ගරු සභාපතිතුමා පාඨක අදහස් ලේඛණ පරීක්ෂා කරන ලදි.

**තීරණය :** සභාපතිතුමා විසින් ප්‍රජා සංවර්ධන නිලධාරිනියට ප්‍රකාශ කර සිටියේ පාඨක අදහස් ලේඛණ පරීක්ෂා කොට ඉදිරි කටයුතු කරන ලෙසයි.

12. ඕකන්ද ශාඛා පුස්තකාලයේ පුස්තකාල සහායිකා වන මාලතී ආරියසිංහ මිය විසින් තම පුස්තකාලයට ඉරිදා රිවර පුවත්පත අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදි.

**තීරණය :** ගරු සභාපතිතුමා අදහස් දක්වමින් කියා සිටියේ පාඨක සමීක්ෂණයක් කර දැනට ගන්නා ලද පුවත්පත් වලින් අඩුවෙන් කියවෙන පුවත්පතක් ඉවත් කර ඉරිදා රිවිර ගැනීමට කටයුතු කරන ලෙසයි.

13. හෙප්පුමුල්ල ශාඛා පුස්තකාලයේ පුස්තකාල සහායිකා වන ගෞරී වරුසවිතාන මිය විසින් තම පුස්තකාලයට ලී සිවිලිමක් අවශ්‍ය බව ප්‍රකාශ කරන ලදි.

**තීරණය :** ගරු සභාපතිතුමා ප්‍රකාශ කර සිටියේ අදාල නිලධාරියා මගින් එම කාර්ය කර ගතයුතු බවත්ය.

වෙනත් කරුණු ඉදිරිපත් නොවු බැවින් ගරු සභාපතිතුමා ස්තූති කතාව කිරීමට ලේකම් මහතාට ආරාධනා කරන ලදි. එහිදී ලේකම් මහතා ස්වේච්ඡාවෙන් කමිටුවට පැමිණි සියලුම කමිටු සාමාජික මහතුන්ට හා ප්‍රජා සංවර්ධන නිලධාරි ඇතුලු පුස්තකාල කාර්ය මණ්ඩලයට ස්තූතිය ප්‍රකාශ කරමින් කමිටුවේ වැඩ අවසන් කරන ලදි.

.....................................

කමිටු ලේකම්

නගර සභාව අම්බලන්ගොඩ

.......................................

ලේකම්

නගර සභාව අම්බලන්ගොඩ

.........................................

අත්සන් කලේ සභාපති

නගරසභාව අම්බලන්ගොඩ

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>

මෙම වාර්තාවෙහි පුස්තකාලය සඳහා අවශ්‍ය පරිගණක මෘදුකාංගයක් ගැනීම සඳහාත් ඊ ලයිබ්‍රරිය සඳහා මෘදුකාංගයක් ලබා ගැනීමටත් අනුමැතිය ඉල්ලා තිබෙනවා.

ඒ අනුව එම මෘදුකාංග ලබා ගැනීම සුදුසු යැයි ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ස්ථිර කරන ලදී.

**ඒ අනුව 2013 -05- 02 දින පවත්වන ලද පුස්තකාල කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 2** **2013- 03-28** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද පොල්වත්තපුර නගර සභා නිවාසලාභීන් සඳහා ඔප්පු ලබා දීම පිළිබඳ කමිටු වාර්තාව පිලිගත යුතු බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරන ලදී.

## පොල්වත්තපුර නගර සභා නිවාසලාභීන් සඳහා ඔප්පු ලබා දීම පිළිබඳව

## 2013.03.28 දින නගර සභා රැස්වීම් ශාලාවේ පැවති නිවාස කමිටු වාර්තාව

**කමිටු සාමාජික පැමිණීම**

ඇම්.ඩබ්.අරුණ ප්‍රදීප් සභාපතී නගර සභාව, අම්බලන්ගොඩ

එම්.ඩබ්. රාහුල ලලිතවික්‍රම නගර සභා මන්ත්‍රී නගර සභාව, අම්බලන්ගොඩ

ජේ.ඩබ්. ජයන්ත නගර සභා මන්ත්‍රී නගර සභාව, අම්බලන්ගොඩ

බී.ජනිත් වික්‍රමතිලක නගර සභා මන්ත්‍රී නගර සභාව, අම්බලන්ගොඩ

ඩී.වි.සුනිල් ලේකම් නගර සභාව, අම්බලන්ගොඩ

ශාන්ති ඩී.රාමනායක ප්‍රධාන කළමණාකරණ සහකාර නගර සභාව, අම්බලන්ගොඩ

එම්.පී.ආර්. පුෂ්පකුමාර සංවර්ධන සහකාර/ නගර සභාව, අම්බලන්ගොඩ

ආදායම් අංශ ප්‍රධානී

අම්බලන්ගොඩ , පොල්වත්තපුර නිවාසලාභීන් සඳහා ඔප්පු ලබාදීම පිළිබඳව සළකා බැලීමට 2013.03.28 දින පෙ.ව. 9.30 ගරු සභාපතිතුමාගේ ප්‍රධානත්වයෙන් ඉහත නම් සඳහන් කමිටුව රැස් වූ අතර පහත සඳහන් තීරණ කමිටුව විසින් ගන්නා ලදි.

01. අංක 241/17 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ ගාල්ලගේ හදාවතී මහත්මියයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ කේ.ඒ. රූපසේන යන අය බව ප්‍රකාශ කර සිටින අතර ඔහු මිය ගොස් ඇත.පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8036/2007/3/27 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක 4624 දරණ කේ.ඒ.රූපසේන මයා ගේ මරණ සහතිකයේ පිටපත.
3. අංක 898323 දරණ පදිංචි සහතිකය
4. ගාල්ලගේ හදාවතී මහත්මියගේ ජාතික හැඳුනුම්පතේ පිටපත.
5. අංක 1304 දරණ විවාහ සහතිකය

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව කේ.ජී. රූපසේන මහතා මිය ගොස් ඇති බැවින්, ඔහුගේ බිරිඳ වන ගාල්ලගේ භද්‍රාවතී යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

02. අංක 241/16 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි මාදුවගේ නන්දාවතී මහත්මියයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ මාදුවගේ නන්දාවතී යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8006/2007/3/21 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක ඩබ් 898312 දරණ පදිංචි සහතිකය
3. ජාතික හැඳුනුම්පතේ පිටපත.
4. 2013 පෙබරවාරි මස විදුලි බිල්පත හා ජල බිල්පත
5. දේපල තක්සේරු දැන්වීම

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මාදුවගේ නන්දාවතී යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

03. අංක 241/21 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි කටුවන ඒකනායක ගුණවතී මහත්මියයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ එම්.ඩබ්.සෝමසිරි යන අය බව ප්‍රකාශ කර සිටින අතර ඔහු මිය ගොස් ඇත.පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8002/2007/3/21 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක 926 දරණ මනිමෙල්වඩු නදුන් ගීතානන්ද පුතාගේ උප්පැන්න සහතිකයේ පිටපත
3. අංක ඩබ් 898315 දරණ පදිංචි සහතිකය
4. ජාතික හැඳුනුම්පතේ පිටපත.
5. දිවුරුම් ප්‍රකාශය.
6. එම්.ඩබ්. සෝමසිරි නමින් වරිපනම් බදු, ජල බිල්පත්,විදුලි බිල්පත්, ගෙවා ඇති කුවිතාන්සි පිටපත්
7. අංක 2367 දරණ මනිමෙල්වඩු සෝමසිරි මයා ගේ මරණ සහතිකයේ පිටපත.

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව එම්.ඩබ්.සෝමසිරි මහතා මිය ගොස් ඇති බැවින්, ඔහුගේ බිරිඳ වන කටුවන ඒකනායක ගුණවතී යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

04. අංක 241/20 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි තුයියලාගේ මහින්දදාස යන අය පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8053/2007/3/28 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක ඩබ් 898325 දරණ පදිංචි සහතිකය

3. ජාතික හැඳුනුම්පතේ පිටපත.
4. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත් වල පිටපත්
5. ගෙවන ලද වරිපනම් බිල්පතක පිටපතක්
ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව තුයියලාගේ මහින්දදාස යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.
05. අංක 241/19 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ පොරවගමගේ රණසිරි යන අයයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ එම්.බී.එෆ්.ජයසූරිය යන අයයි. ජයසූරිය මහතා විසින් 2000.11.18 දිනැති ලියවිල්ලක් මගින් රු. 90000.00 ක මුදලකට පී.ජී. රණසිරි යන අයට විකුණා ඇතිබවට සඳහන් ලියවිල්ලේ පිටපතක් ඉදිරිපත් කරමින් ඒ බව ප්‍රකාශ කර සිටි. පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8011/2007/3/22 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. මෙම දේපල එම්.බී.එෆ්.ජයසූරිය යන අය විසින් පොරවගමගේ රණසිරිට විකුණා ඇතිබවට වූ ලියවිල්ලේ පිටපත. .
3. අංක ඩබ් 898322 දරණ පදිංචි සහතිකය
4. ජාතික හැඳුනුම්පතේ පිටපත.
5. පී.ජී. රණසිරි නමින් ජල බිල්පත්,විදුලි බිල්පත්, ගෙවා ඇති කුවිතාන්සි

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පොරවගමගේ රණසිරි යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

06. අංක 241/23 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ ක්‍රිස්තොම්බු ජයංගනී යන අයයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ එස්.ටී. විජිත යන අයයි. මෙම දේපල එස්.ටී.විජිත විසින් 1994.05.05 දිනැති ලියවිල්ලක් මගින් රු. 125000.00 ක මුදලකට කේ.ජයංගනී යන අයට විකුණා ඇතිබවට සඳහන් ලියවිල්ලේ පිටපතක් ඉදිරිපත් කරමින් ඒ බව ප්‍රකාශ කර සිටි. පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8017/2007/3/23 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. මෙම දේපල එස්.ටී. විජිත යන අය විසින් ක්‍රිස්තොම්බු ජයංගනීට විකුණා ඇති බවට වූ ලියවිල්ලේ පිටපත. .
3. අංක ඩබ් 898319 දරණ පදිංචි සහතිකය
4. කේ.ජයංගනී නමින් ජල බිල්පත්,විදුලි බිල්පත්, ගෙවා ඇති කුවිතාන්සි පිටපත්.
07. අංක 241/22 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ කුකුලගේ ජයසිරි සිල්වා යන අයයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ කුකුලගේ සයිමන් සිල්වා යන අය බව ප්‍රකාශ කර සිටින අතර ඔහු මිය ගොස් ඇත.පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8029/2007/3/26 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.

2. අංක 4355 දරණ කේ.සයිමන් සිල්වා මහතාගේ මරණ සහතිකයේ පිටපත

3. අංක ඩබ් 898335 දරණ පදිංචි සහතිකය

4. ජාතික හැඳුණුම්පතේ පිටපත.

5. දිවුරුම් ප්‍රකාශය.

6. කේ.ජයසිරි නමින් , ජල බිල්පත් ගෙවා ඇති කුවිතාන්සි පිටපත

7. අංක බීඒ/2005/47 දරණ ගොඩනැගිලි අයදුම්පත කේ.ජයසිරි මයා ගේ නමින් අනුමත පිටපත.

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව කේ.සයිමන් ද සිල්වා මහතා මිය ගොස් ඇති බැවින්,මෙම නිවසේ දීර්ඝකාලීනව පදිංචිව සිටින ඔහුගේ පුතා වන කේ.ජයසිරි යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

**08.** **අංක 241/01 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ, ඩබ්.ටී.යසවතී මහත්මියයි. පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.**

**1. අංක 8049/2007/3/27 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.**

**2. බී.ඒ.4/93 දරණ ගොඩනැගිලි සැළැස්ම අනුමත පිටපත**

**3. ඩබ්.ටී. යසවතී නමින් ගෙවන ලද ජල,විදුලි,බිල්පත් වල පිටපත්**

**4. අංක 898330 දරණ පදිංචි සහතිකය**

**5. ජාතික හැඳුණුම්පත් අංකය**

**ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම ඉඩම් කොටසේ අයිතිය පිළිබඳව පැවරුම් නියෝගය ලබා ගැනීම සඳහා හඳුනා ගැනීම සුදුසු බවට කමිටුව නිරිදේශ කරන ලදි.**

**09. අංක 241/03බී , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ, මල්ලියාවඩු දිනේෂ්කුමාර යන අයයි. පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.**

**1. ජාතික හැඳුණුම්පතේ පිටපත**

**ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම ඉඩම් කොටසේ අයිතිය පිළිබඳව පැවරුම් නියෝගය ලබා ගැනීම සඳහා හඳුනා ගැනීම සුදුසු බවට කමිටුව නිරිදේශ කරන ලදි.**

**10. අංක 241/02 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ, පොරවගමගේ යසවතී මහත්මියයි. පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.**

**1. අංක 8062/2007/3/30 දරණ බිම් බද්ධ ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.**

**2. අංක 899320 දරණ පදිංචි සහතිකය**

**3. පී.පී. යසවතී නමින් ගෙවන ලද ජල,විදුලි,බිල්පත් වල පිටපත්**

**ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මෙම ඉඩම් කොටසේ අයිතිය පිළිබඳව පැවරුම් නියෝගය ලබා ගැනීම සඳහා හඳුනා ගැනීම සුදුසු බවට කමිටුව නිරිදේශ කරන ලදි.**

11. අංක 241/03 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි මල්ලියාවඩු සිසිර සමන්ත යන අයගේ නමින් නගර සභාවට වරිපනම් බදු ගෙවනු ලබයි. පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. තක්සේරු දැන්වීමේ පිටපත

2. ජාතික හැඳුණුම්පතේ පිටපත

3. ඩබ්.ටී. සිසිර සමන්ත නමින් ගෙවන ලද ජල,විදුලි, බිල්පත්වල පිටපත්.

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මල්ලියාවඩු සිසිර සමන්ත යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

12. අංක 241/05 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ මල්ලියාවඩු සුසන්ත යන අයයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ මල්ලියාවඩු සුසන්ත යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8010/2007/3/22 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.

2. අංක ඩබ් 898318 දරණ පදිංචි සහතිකය

3. ජාතික හැඳුණුම්පතේ පිටපත.

4. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත්

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව මල්ලියාවඩු සුසන්ත යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

13. අංක 241/07 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි එච්.එල්.සුගතදාස යන අයගේ නගර සභා ලේඛනවල සඳහන් පරිදි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ එච්.එල්.සුගතදාස යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8019/2007/3/23 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.

2. අංක ඩබ් 898324 දරණ පදිංචි සහතිකය

3. ජාතික හැඳුණුම්පතේ පිටපත.

4. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත්

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව එච්.එල්. සුගතදාස යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

14. අංක 241/09 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ඒ,එච්. ජයවතී යන අයගේ නගර සභා ලේඛනවල සඳහන් පරිදි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ ජේ.ඒ.පිනදාස යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. ජේ.ඒ.පිනදාස නමින් ඇති තක්සේරු දැන්වීමේ පිටපත

2. ඒ.එච්.ජයවතී නමින් ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත්

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පදිංචි සහතිකය හා අනෙකුත් අදාල ලේඛන ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ඒ.එච්.ජයවතී යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

15. අංක 241/08 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ ගාල්ලගේ ලලිත් ප්‍රේමලාල් යන අයයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ කටුවන ඒකනායක කරුණාවතී යන අය බව ප්‍රකාශ කර සිටින අතර ඇය මිය ගොස් ඇත.පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8018/2007/3/23 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක 5804 දරණ කේ.ඒ. කරුණාවතී යන අයගේ මරණ සහතිකයේ පිටපත
3. අංක ඩබ් 898321 දරණ පදිංචි සහතිකය
4. ජාතික හැඳුනුම්පතේ පිටපත.
5. දිවුරුම් ප්‍රකාශ- ගාල්ලගේ ලලිත් ප්‍රෙමලාල් මයා විසින් ඉදිරිත් කරන ලද දිවුරුම් ප්‍රකාශය හා ඔහුගේ සහෝදරයන් වන ගාල්ලගේ පත්මලාල්,ගාල්ලගේ බුද්ධික චන්ද්‍රලාල් යන අයගේ දිවුරුම් ප්‍රකාශ, සහ ඔහුගේ සහෝදරිය වන ගාල්ලගේ සෙල්පා සෙනෙහෙලතා යන අයගේ දිවුරුම් ප්‍රකාශය.
6. කේ.ඒ. කරුණාවතී නමින් ජල, විදුලි බිල්පත් ගෙවා ඇති කුවිතාන්සි පිටපත්
7. තක්සේරු දැන්වීම

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව කේ.ඒ කරුණාවතී යන අය මිය ගොස් ඇති බැවින්,මෙම නිවසේ දීර්ඝකාලීනව පදිංචිව සිටින ඔහුගේ පුතා වන ගාල්ලගේ ලලිත් ප්‍රේමලාල් යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

16. අංක 241/03 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ජුවන්වඩු සීලවතී යන අයගේ නගර සභා ලේඛනවල සඳහන් පරිදි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ ජුවන්වඩු සීලවති යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8054/2007/3/28 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක ඩබ් 898314 දරණ පදිංචි සහතිකය
3. ජාතික හැඳුනුම්පතේ පිටපත.
4. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත්
5.තක්සේරු දැන්වීමේ පිටපත

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ජුවන්වඩු සීලවති යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

17. අංක 241/11 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගාර්දිහේවා වසම් ගමගේ චන්ද්‍රජිත් යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8035/2007/3/27 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක ඩබ් 898311 දරණ පදිංචි සහතිකය

3. ජාතික හැඳුනුම්පතේ පිටපත.
4. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත්
5. වරිපනම් ගෙවන ලද කුවිතාන්සි
ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගාර්දිහේවා වසම් ගමගේ චන්ද්‍රජිත් යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

18. අංක 241/10 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි අලුත්වලහේවා පත්මපාල යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.
1. අංක 8061/2007/3/29 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක ඩබ් 898327 දරණ පදිංචි සහතිකය
3. ජාතික හැඳුනුම්පතේ පිටපත.
4. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත්
5. වරිපනම් ගෙවන ලද කුවිතාන්සි
ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව අලුත්වලහේවා පත්මපාල යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

19. අංක 241/14 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි පටබැඳිගේ යසරත්න යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.
1. අංක 8033/2007/3/27 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක ඩබ් 898313 දරණ පදිංචි සහතිකය
3. ජාතික හැඳුනුම්පතේ පිටපත.
4. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත් වල පිටපත්
5. වරිපනම් ගෙවන ලද කුවිතාන්සි පිටපත්
ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පටබැඳිගේ යසරත්න යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

20. අංක 241/15 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගොන්සාලුවසම් ආරියවතී යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.
1. අංක 8032/2007/3/26 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක ඩබ් 898317 දරණ පදිංචි සහතිකය
3. ජාතික හැඳුනුම්පතේ පිටපත.
4. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත් වල පිටපත්
5. තක්සේරු දැන්වීමේ පිටපත
ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගොන්සාලුවසම් ආරියවති යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

21. අංක 241/18 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගාල්ලගේ බන්දුවතී යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.
1. අංක ඩබ් 898329 දරණ පදිංචි සහතිකය

2. ජාතික හැඳුනුම්පතේ පිටපත.
3. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත් වල පිටපත්
4. තක්සේරු දැන්වීමේ පිටපත

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව ගාල්ලගේ බන්දුවතී යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

22. අංක 241/06 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි හේවාගේ මැපියා පොන්සේකා යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.
1. අංක ඩබ් 898328 දරණ පදිංචි සහතිකය
2. ජාතික හැඳුනුම්පතේ පිටපත.
3. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත් වල පිටපත්
4. ගෙවන ලද වරිපනම් බිල්පතෙහි පිටපත.

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව හේවාගේ මැපියා පොන්සේකා යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

23. අංක 241/04 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ අලුත්වලහේවා පේමවතී යන අයයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ මල්ලියාවඩු සිරිසේන යන අය බව ප්‍රකාශ කර සිටින අතර ඔහු මිය ගොස් ඇත.පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.
1. අංක 8026/2007/3/26 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.
2. අංක 5555 දරණ මල්ලියාවඩු සිරිසේන යන අයගේ මරණ සහතිකයේ පිටපත
3. ජාතික හැඳුනුම්පතේ පිටපත.
4. ජල, විදුලි බිල්පත් ගේවා ඇති කුවිතාන්සි පිටපත්
5. තක්සේරු දැන්වීම

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පදිංචි සහතිකය හා අනෙකුත් ලේඛන ලබා දීමෙන් අනතුරුව මල්ලියාවඩු සිරිසේන යන අය මිය ගොස් ඇති බැවින්,මෙම නිවසේ දීර්ඝකාලීනව පදිංචිව සිටින ඔහුගේ බිරිඳ වන අලුත්වල හේවා පේමවතී යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

24. අංක 241/12 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි සල්පදෝරු තුප්පහි ප්‍රේමදාස යන අය බව ප්‍රකාශ කර සිටින අතර පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.
1. අංක ඩබ් 898326 දරණ පදිංචි සහතිකය
2. ජාතික හැඳුනුම්පතේ පිටපත.
3. ගෙවන ලද විදුලි බිල්පත් හා ජල බිල්පත් වල පිටපත්
4. ගෙවන දල වරිපනම් බිල්පතෙහි පිටපත
5. අංක 8037/2007/3/27 දරණ බිම් බද්ද ගෙවා ඇති බවට කුවිතාන්සියේ පිටපත.

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව සල්පදෝරු තුප්පහි ප්‍රේමදාස යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

25. අංක 241/09 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ අලුත්වලහේවා ජයවතී යන අයයි. නගර සභා ලේඛනවල සඳහන් පරිදි මෙහි මුල් අයිතිකරු වශයෙන් සඳහන් වන්නේ ජයකොඩි ආරච්චිගේ පින්දාස යන අය බව ප්‍රකාශ කර සිටින අතර ඔහු මිය ගොස් ඇත.පහත සඳහන් ලිපි ලේඛන ඉදිරිපත් කර ඇත.

1. අංක 8817 දරණ පුතාගේ උප්පැන්න සහතිකයේ පිටපත.

2. අංක 9275 දරණ ජයකොඩි ආරච්චිගේ පින්දාස යන අයගේ මරණ සහතිකයේ පිටපත

5. අලුත්වල හේවා ජයවතී යන අය විසින් ඉදිරිපත් කරන ලද දිවුරුම් ප්‍රකාශය.

ඉහත ලේඛන පරීක්ෂා කිරීමෙන් අනතුරුව පදිංචි සහතිකය හා අනෙකුත් ලේඛන ලබා දීමෙන් අනතුරුව ජයකොඩි ආරච්චිගේ පින්දාස යන අය මිය ගොස් ඇති බැවින්,මෙම නිවසේ දීර්ඝකාලීනව පදිංචිව සිටින ඔහුගේ බිරිඳ වන අලුත්වල හේවා ජයවතී යන අයට ඔප්පු ලබා දීමට කමිටුව නිර්දේශ කරන ලදි.

සකස් කළේ :

එම්.පී.ආර්.පුෂ්පකුමාර

සංවර්ධන සහකාර/ ආදායම් අංශ ප්‍රධානී

ලේකම්,

නගර සභාව,

අම්බලන්ගොඩ

<u>තීරණය</u>

**6:2:1** **අංක 241/17 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින ගාල්ලගේ හදාවතී මහත්මියට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6:2:2** **අංක 241/16 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි මාදුවගේ නන්දාවතී මහත්මියට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6:2:3** **අංක 241/21 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි කටුවන ඒකනායක ගුණවතී මහත්මියට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6:2:4** අංක 241/20 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි තුයියලාගේ මහින්දදාස යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:5** අංක 241/19 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි පොරවගමගේ රණසිරි යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:6** අංක 241/23 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ක්‍රිස්තොම්බු ජයංගනී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:7** අංක 241/22 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ කුකුලගේ ජයසිරි සිල්වා යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:8** අංක 241/01 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ, ඩබ්. ටී. යසවතී මහත්මියට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:9** අංක 241/03 බී , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින මල්ලියාවඩු දිනේෂ් කුමාර යන අයට ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් නැවත කමිටුවක් රැස්කර ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.

**6:2:10** අංක 241/02 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින පොරවගමගේ යසවතී යන අයට ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් නැවත කමිටුවක් රැස්කර ඔප්පු ලබා දීම සම්බන්ධයෙන් තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.

**6:2:11** අංක 241/03 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි මල්ලියාවඩු සිසිර සමන්ත යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:12** අංක 241/05 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ මල්ලියාවඩු සුසන්ත යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:13** 241/07 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි එච්. එල්. සුගතදාස යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:14** අංක 241/09 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ඒ.එච්. ජයවතී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:15** අංක 241/08 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ ගාල්ලගේ ලලිත් ප්‍රේමලාල් යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:16** අංක 241/03 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ජුවන්වඩු සීලවතී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:17** අංක 241/11 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගාර්දිහේවා වසම් ගමගේ චන්ද්‍රජිත් යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:218** අංක 241/10 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි අලුත්වලහේවා පත්මපාල යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:19** අංක 241/14 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි පටබැඳිගේ යසරත්න යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:20** අංක 241/15 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගොන්සාලුවසම් ආරියවතී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:21** අංක 241/18 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි ගාල්ලගේ බන්දුවතී යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

**6:2:22** **අංක 241/06 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි හේවාගේ මැපියා පොන්සේකා යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6:2:23** **අංක 241/04 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ අලුත්වලහේවා පේමවතී යන අයට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6:2:24** **අංක 241/12 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචි සල්පදෝරු තුප්පහි ප්‍රේමදාස යන අයට ඔප්පු ලබා දීමට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**6:2:25** **අංක 241/09 , පොල්වත්තපුර, අම්බලන්ගොඩ ලිපිනයේ පදිංචිව සිටින්නේ අලුත්වලහේවා ජයවතී යන අයට සුදුසු බවට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතක්‍රම මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මාර්තු 11 අවසන් තීරනේ දෙනවයි කිව්ව කැටැන්තොට ක්‍රීඩා පිටියේ ඉඩම් ප්‍රශ්නයට. ඒකට මොකද වුනේ. ඒ අයට වෙන තැනක් ලබා දෙනවද. මේකට මොකක් හරි කරන්න ඕනෙ ක්‍රීඩා පිටිය ලොකු කරගන්න.

**ඒ අනුව 2013 -03-28 දින පවත්වන ලද පොල්වත්තපුර නගර සභා නිවාසලාභීන් සඳහා ඔප්පු ලබා දීම පිළිබඳ කමිටු වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.**

**6: 3** **2013- 03- 12** දින අම්බලන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාවේදී පවත්වන ලද ස්වයං රැකියාලාභීන්ට නගර සභා සීමාව තුල ස්ථාන ලබා දීම පිළිබඳව කමිටු වාර්තාව නැවත ඉදිරිපත් කරන බවට ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරන ලදී.

ස්වයංරැකියා ලාභීන්ට ස්ථාන ලබා දීමේදී හිරවත්ත බුදු පිළිමය අසල දුම්රිය මාර්ගය හා මහා මාර්ගය අතර බිම් තීරුව ස්වයංරැකියාවක් ලෙස විසිතුරු මල් පැල වෙළඳාම කරන්නන්ට ලබාදීමට යෝජනා වූ බවත් මෙම කරුණ සම්බන්ධව කෘෂිකර්ම උපදේශිකාව සමග සාකච්ඡා කල බවත් එහිදී මෙම වෙළඳ කුටි 10X5X6 ප්‍රමාණයෙන් සකස් විය යුතු බවත් වෙළඳ කුටි සඳහා ජල හා විදුලි පහසුකම් ලබා දිය යුතු බවත් වෙළඳ කුටියට වහලක් ගැසිය යුතු බවත් කෘෂිකර්ම උපදේශිකාව විසින් සුදුසු ස්වයං රැකියාලාභීන් තෝරා ගැනීම සිදු කරන බවත් ඊට අමතරව නගර සභාව විසින් යෝජනා කර ඇති පරිදි වෙළඳ කුටි ලබා දීමේදී ගිවිසුම්ගත විය යුතු බවත් මාසික කුලිය නගර සභාව විසින් තීරණය කල යුතු බවත් වෙළඳ කුටි අතුරු බදු දීම් නොකල යුතු බවත් සුදුසු ස්වයංරැකියාලාභීන් කෘෂිකර්ම උපදේශිකාව විසින් තේරීම් කල යුතු බවත් දක්වා තිබුණි.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි සරත් මහත්මයගෙ කඩේ ලග ලොතරැයි කුඩු හතක් විතර තියෙනවා. අපි සභාවේ අනුමත කරෙ දෙකයි. අපිත් කැමතියි සභාපතිතුමනි අපේ කෙනෙක්ට ඔතන කඩයක් දාන්න ලබා දෙන්න. මටනම් සභාපතිතුමනි ඔතනින් කඩ කෑල්ලක් ඕනෙ. මට නෙමෙයි මිනිස්සුන්ට. අපේ ගමෙත් ඉන්නව නගරයට එන්න අවශ්‍ය මිනිස්සු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අම්බලන්ගොඩ නගරයේ සංවර්ධන කටයුතු සිද්ධ වෙනකොට අපේ ස්වයංරැකියා කරන අය සම්බන්ධයෙන් ප්‍රශ්න ගැටලු තියෙන අය ඉන්නවා. අපි ව්‍යාපාර ක්ෂෙත්‍රය තුල නිරතවුවන් හැටියට අපිත් දන්නව මේ ගැටලු. මට මතක විදියට සභාපතිතුමනි ඔබතුමාගෙ පළමු සභාපතිධුර කාලය තුල බස් නැවතුම් පොලෙහි කඩ හතරක් ස්ථාපනය වෙලා තිබුණා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

විශේෂයෙන්ම කිව යුතුයි මන්ත්‍රීවරුන්ට කඩ ලබා දෙන්නෙ නැහැ. නගරයේ ඉන්න ස්වයංරැකියා ලාභීන්ටයි ලබා දෙන්නෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි නගරයේ ඉන්න ස්වයංරැකියාලාභීන්ට මේ අවුරුදු 15 කාලය තුලදි එහෙම ලබා දුන්නෙ නෑ. අපි අවශ්‍ය වෙලාවෙදි අවශ්‍ය දේ ලබා දෙන්න ඕනෙ. පසුව දීල වැඩක් නැහැ. දැනටත් ප්‍රමාද වැඩියි ගරු සභාපතිතුමනි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මේ වාර්තාව අනුව හිරේවත්ත බුදු පිළිමය අසල සිට දුම්රිය මාර්ගය හා මහා මාර්ගය අතර බිම් තීරුව ස්වයංරැකියාවක් ලෙස විසිතුරු මල්පැල වෙළදාම කරන්නන්ට ලබා දීමට යෝජනා කරල තියෙනවා. මෙම කරුණ සම්බන්ධව කෘෂිකර්ම උපදේශිකාව සමග සාකච්ඡා කරල එහිදි මෙම වෙළද කුටි 10X5X6 ප්‍රමාණයෙන් සකස් විය යුතු බවත් වෙළද කුටි සඳහා ජල හා විදුලි පහසුකම් ලබා දිය යුතු බවත් වෙළද කුටියට වහලක් ගැසිය යුතු බවත් කෘෂිකර්ම උපදේශිකාව විසින් සුදුසු ස්වයං රැකියාලාභීන් තෝරා ගැනීම සිදු කරන බවත් සඳහන් කරල තියෙනව. ඊට අමතරව නගර සභාව විසින් යෝජනා කරල තියෙනව වෙළද කුටි ලබා දීමේදී ගිවිසුම්ගත විය යුතු බවත් මාසික කුලිය නගර සභාව විසින් තීරණය කල යුතු බවත් වෙළද කුටි අතුරු බදු දීම් නොකල යුතු බවත් සුදුසු ස්වයංරැකියාලාභීන් කෘෂිකර්ම උපදේශිකාව විසින් තේරීම් කල යුතු බවත් සඳහන් කරල තියෙනවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපි මහජනතාවගේ ඡන්දෙන් ඇවිල්ල තියෙන්නෙ. අපි සේවය කරන කොට දැනගන්න ඕනෙ මේ නගරයේ තියෙන දේවල් ගන්නවට මම කැමති නැහැ. අනිත් එක මේ දේවල් ක්‍රමවේදයකට යන්න ඕනෙ. ඔබතුමා කියනව කඩේක ගහන්න පුලුවන් දිග පළල මෙච්චරයි කියලා. ඔබතුමා බලන්න බස් නැවතුම්පොලෙන් දුම්රිය ස්ථානයට යන තැන තියෙන කඩේ දිග එළල කොච්චරද කියලා. මිනිස්සු දොස් කියන එව අපිට ඇහෙනව. ඒනිසා නිසි පාලනයකින් වැඩ කරන එක අපේ වගකීම. කරන දෙයක් විනිවිද භාවයකින් කරන්න. තැන් තැන්වල ලොතරැයි කුඩු තියෙනවා. මම අහනවා මේව කීයක් අනුමැතිය අරගෙන තියෙනවද කියලා. නිලධාරීන් හරියට වැඩ කරොත් තමයි අපිට ඊලග පාර බලයට එන්න

වෙන්නෙ. කොළඹ ගත්තහම කොච්චර බැහැයි කිව්වත් යම් ක්‍රමවේදයකට යනවා. ඒ නිසා මම කියන්නෙ නගරෙ නිසි ලෙස යම් ක්‍රමවේදයකට යන්න කියලා. ඒවගේම විනිවිද භාවයකින් කටයුතු කරන්නයි කියලා ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි අපි මිට පෙර කතා කරා ජනතාවට ඔප්පු ලබා දීම සම්බන්ධව. දැන් මේ කතා කරන්නෙත් ජනතාවට ලබා දීමක් සම්බන්ධව. සහෝදර මන්ත්‍රීවරුන්ගෙ ප්‍රදේශවල ඉන්න ඔප්පු නොමැති අයට ඔප්පු ලබා දීම වගේම අපේ ප්‍රදේශවල ඉන්න ස්වයංරැකියා කරන අයට යම් ස්ථානයක් ලබා දීම. එක් එක් අයගෙ එක් එක් අවශ්‍යතා තියෙන්නෙ. ඒ දේ අවශ්‍ය නැති සහෝදර මන්ත්‍රීවරු ඉන්නවා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා විසින් ගරු නගර සභා මන්ත්‍රී කමල් වැල්ලගේ මහතාට මෙම කරුණ සම්බන්ධව කරුණු දැක්වීමට අවස්ථා දෙකක් ලබා නොදිය හැකි බව ප්‍රකාශ කල බැවින් සභාවේ ඝෝෂාකාරී තත්වයක් ඇති විය.**

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි තමුන්නාන්සේලාගේ බලය තියෙන්නෙ. මම ඉල්ලා සිටින්නෙ මිනිස්සුන්ට අපහසුතා වන විදියට මේ කඩ දාන්න එපා කියල මම ඉල්ලීමක් කරනවා. අපි පයින් යන මිනිස්සු. බස් නැවතුම් පොලේ දකුණු මායිමේ බලන්න බස් නැවැත්තුවහම පදිකයක් තියෙනවා. බලන්න පදිකයේ තියෙන්නෙ මොනවද කියලා. ඒව බලලා තමුන්නාන්සේලාට ඕන දෙයක් කරන්නයි කියලා මම ඉල්ලා සිටිනවා. අපි ඉල්ලන්නෙ නෑ අපේ කෙනෙක්ට දෙන්න කියලා. අපි ඉල්ලන්නෙ ජනතාවට හිරිහැරයක් නොවෙන්න දෙන්න කියලා. අපේ බස් නැවතුම් පොල අනික් නගර වලට ආදර්ශයක් වෙන දියට පාලනය වෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටින්නේ ඒ පිරිසිදුතාවය පවත්වා ගැනීමටත් ජනතාවට හිරිහැරයක් නොවන ආකාරයට මෙම ස්ථාන පාලනය කරන්නත් කියල අපි ඉල්ලා සිටිනවා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි මේ සබාව පවත්වාගෙන යන නීතියක් තියෙනවා. ඊට පිටින් යනවනම් යම් මන්ත්‍රීවරයෙක් ඔබතුමාට ඒක හරිගස්සන බලය තියෙනවා. අපි නිතරම බලන්නෙ සභාපතිතුමනි අපේ නගරය පිරිසිදුව තියා ගන්න. මේක අපේ වගකීම. මගේ කිසිම විරුද්ධත්වයක් නැහැ නගරයේ ස්වයංරැකියා කරන අයට යම් ස්ථානයක් ලබා දෙන එකට. නමුත් ජනතාවට මේ බස් නැවතුම්පොල වටේ තියෙන ලොතරැයි කුටි වලින් වෙන හානිය අපි හැමෝම දන්නවා. නමුත් ස්වයංරැකියා කරන දෙන්න අවශ්‍ය කෙනෙක් ඉන්නව නම් නගරයට අවලස්සනයක් නොවෙන විදියට මහජනතාවට හිරිහැරයක් නොවන විදියට දුන්නට කමක් නැහැ. මට පේන විදියට මේ සැලසුම් කරපු ආකාරය නගරයට විශාල හානියක්. මම දැක්ක ඔරලෝසු කණුව ලගින් ඇතුල්වෙන තැනත් ඇඳල තියෙනව එකක්. පාලම ලග ඉඳල මෙහාට ස්ථාපනය කරන එකට මගේ විරුද්ධතාවක් නැහැ. අපි ස්වයංරැකියා කරන අයට ස්ථාන ලබා දිය යුතුයි. හැබැයි ඒකෙන් මේ නගරයට එන ජනතාවට හිරිහැරයක් වෙනව නම් ඒකත් අපි භාර ගත යුතුයි. අපි නැවත ජනතාවගෙන් ඡන්දයක් ඉල්ලන්න යන්න අද හරියට වැඩ කරන්න ඕනෙ. අම්බලන්ගොඩ නගරය බුද්ධිමතුන්ගේ නගරයක් ඒ නිසා ගන්න තීරණ බුද්ධිමත්ව ගන්න කියල මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි අපේ මන්ත්‍රීවරුන්ට නියෝජනය කරන ප්‍රදේශය අනුව එක් එක්කෙනාට ආවේනික ප්‍රශ්න තියෙනවා. මෙහිදී මගේ පුද්ගලික මතය ඒ සියලු දේවල් වලට අපි කන්දිය යුතුයි. ඌරවත්ත පාලම ගල ඉදල මෙහාට මල් වවන්නන්ට දෙන එක හොඳයි. ඒ දෙන කොට කුඩා මල් පැලේ ඉදල ලොකුම පැලයක් දක්වා ජනතාවට ලබා දෙන්න පුලුවන් කෙනෙකුට දෙන්න. නැත්තම් ටික දවසක් යනකොට වෙනත් දේවල් දාවි. ඒකට මට අනුමැතිය දෙන්න කියාවි. අපි මේ කරන ක්‍රම වේදයෙන් නගරයට අලංකාරයත් වෙන්න ඕනෙ. මේක කරනව නම් මම කැමති නගරෙට සහ නගරෙ ජනතාවට ප්‍රතිඵලයත් වෙන විදියට මේක කරනවනම්. නැත්තම් මම විරුද්ධයි. බස් නැවතුම්පොල ඇතුලෙ ස්ථාපනය කිරීම නම් සුදුසු නැහැ. අවලස්සන වීම එකක් අනිත් එක මහජනතාවට අවහිර වීම. මේ කඩ හිමියන් අවසරය ගන්න කම් ඔලුව පහත් කරගෙන ඉන්නවා. ඊට පස්සෙ අපි කියන දෙයක් අහන්නෙ නැහැ. ඒ නිසා මේක අපිට අනුමත කරන්න බැහැ සභාපතිතුමනි. හැබැයි නගර සභාව සතු ඉඩම් තියෙනවා. එයින් එකක කඩ ගහල දෙමු. ඒ නිසා සභාපතිතුමා මේ පිලිබඳව මධ්‍යස්ථව හිතල සිහිනුවනින් අවසන් තීරණයක් ගන්න කියල මම ඉල්ලා සිටිනවා.

<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>

මන්ත්‍රීවරුන්ට කියන්න ඕනෙ බස් නැවතුම් පොල මෙතෙක් විනයක් සහිතව තියාගන්න මම වැඩ කරල තියෙනවා. මම හිතනවා මේ වාර්තාව නැවතත් සමාලෝචනය කිරීම සඳහා කමිටුවට යොමු කිරීම සුදුසුයි කියලා.

<u>තීරණය</u>

මෙම වාර්තාව නැවත නගර සභා සීමාවේ ස්වයංරැකියාවන්හි නියුතු වූවන්ට නගර සභාව මගින් ස්ථාන ලබා දීමේ කමිටුවට යොමු කර එහි නිර්දේශය අනුව තීරණයක් ගැනීමට සභාව තීරණය කරන ලදී.

## (07) ටෙන්ඩර් හා මිල ගණන්

**7:1** <u>ටෙන්ඩර්</u> :-

**7:1:1** **2013- 04- 02** දින මාසික රැස්වීමට ඉදිරිපත් කර තිබූ මිල ගණන් අනුව, අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය ඇතුලු රජයේ ආයතන රැසක් පාවිච්චි කරන බැවිනුත් ISO 9001 : 2008 ලබාගෙන ඇති බැවිනුත් රු. 195000.00 (වැට් රහිතව) ක් මිල වන ජර්මනියේ නිෂ්පාදිත ඉජිමා (iGEBA) නැමති යන්ත්‍රය මිලදී ගැනීමට මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතා වැඩ අධිකාරී මහතා සහ අම්බලන්ගොඩ සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී තුමියගෙන් සැදුම් ලත් කමිටුව විසින් ලබා දුන් නිර්දේශය සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

**7:1:2** ආදායම් හා මූල්‍ය කටයුතු කළමනාකරණ පරිගණක මෘදුකාංග පද්ධතියක් මිලදී ගැනීම සම්බන්ධ දකුණු පළාත් පළාත් පාලන දෙපාර්තමේන්තුව විසින් ඉදිරිපත් කර තිබූ තාක්ෂණික ඇගයීම් වාර්තාව ඉදිරිපත් කර තිබුණි.

| | ආයතනය | මිල ගණන |
|---|---|---|
| 01 | වයඹ සංවර්ධන අධිකාරිය | 630000.00 |
| 02 | Science Änd Software (pvt) Ltd | 800000.00 |
| 03 | Global Town Suite | 2600000.00 |

අවම මිල ගණන් ඉදිරිපත් කර තිබෙන්නේ වයඹ සංවර්ධන අධිකාරිය බැවින්ද එය රාජ්‍ය ආයතනයක් වන අතර පරිගණක මුදුකාංගය අදාල අවශ්‍යතා සපුරා ඇති බැවින්ද එම ආයතනය ඉදිරිපත් කර ඇති පරිගණක මෘදුකාංග පද්ධතිය මිලදී ගැනීම සුදුසු බවට නිර්දේශ කර තිබුණි.

**ඒ අනුව වයඹ සංවර්ධන අධිකාරිය විසින් ඉදිරිපත් කර ඇති පරිගණක මුදුකාංගය මිලදී ගැනීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**7:2** <u>**මිල ගණන්**</u> :-

**7:2:1** Cartridge මිලදී ගැනීම සඳහා මිළ ගණන් කැඳවන ලද අතර ගණකාධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Ramcy Computers | Shiva Computers | LSJ Computers |
|---|---|---|---|---|---|
| 01 | Cannon- LBP 6300 dn Cartridge | 01 | 13500/- | 13750/- | 12750/- |
| | | | | | |

**7:2:2** ට්‍රැක්ටර්වල සවි කරන සීනු කට්ටල සඳහා මිල ගණන් කැඳවන ලද අතර මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිල ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Shantha Electronic | Techno Electronic | Dhammika Electronic |
|---|---|---|---|---|---|
| 01 | ට්‍රැක්ටර්වල සවි කරන සීනු කට්ටල | 06 | 5000/- | 5300/- | 4800/- |
| | | | | | |

**7:2:3** මාර්ගවල සවි කරනු ලබන උත්තල දර්පණ සඳහා මිල ගණන් කැඳවන ලද අතර වැඩ අධිකාරිගේ නිර්දේශය මත ඉදිරිපත් කර ඇති මිල ගණන් අතරින් අවම මිළ ගණන් පිලිගැනීමට සභාව තීරණය කරන ලදී.

| අංකය | ද්‍රව්‍ය හා උපකරණ විස්තරය | ප්‍රමාණය | Oceanic Side Mirror | Antatic Side Mirror | Atlanta Side Mirror |
|---|---|---|---|---|---|
| 01 | 22 ½ X 22 ½ Round Detective Corner Mirror | | 35000/- | 25000/- ( වට්ටම් මිල 22000/-) | 32000/- |

**(08)** **ගෙවීම්**

8. 1 ඇ. අංක 0442 යටතේ ප්‍රධාන පුස්තකාලය වෙත ලබා ගන්නා ලද පරිගණක යන්ත්‍රය වෙනුවෙන් අම්බලන්ගොඩ, ගාලුපාර, වියුලිප් කම්පියුටර්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි, රු. 47100/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.2 ඇ. අංක 0480 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද GAS වෙනුවෙන් අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. ජී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 57920/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

7240/- X 8 - 57920.00

8.3 ඇ. අංක 477 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද GAS වෙනුවෙන් අම්බලන්ගොඩ, මහ අම්බලන්ගොඩ, එම්. ජී. ද සිල්වා මහතා වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 94120/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

7240/- X 13 - 94120.00

8. 4 ඇ. අංක 0447, 0468, 0474 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ගබඩා ද්‍රව්‍ය වෙනුවෙන් පොල්වත්ත, පූර්ණ වෙළඳසැල වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 14210/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Blue powder | 280/- X 1 | - | 280.00 |
| Boiled lime | 250/- X 28 | - | 7000.00 |
| Floor paint (4L) | 2980/- X 1 | - | 2980.00 |
| Thinner (1L) | 210/- X 5 | - | 1050.00 |
| Pad Locks | 290/- X 10 | - | 2900.00 |
| | | | 14210.00 |

8.5 ඇ. අංක 0469 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද Calculator වෙනුවෙන් අම්බලන්ගොඩ, දුම්රියපොල පාර, නෙස්ටර් වර්ක්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 12000/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

Citizen Calculatoß 1200/- X 10 - 12000.00

8.6 ඇ. අංක 0467 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් අම්බලන්ගොඩ, මහා වීදිය, රජයේ මුද්‍රණ නීතිගත සංස්ථාව වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 14075/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| A4 White | 585/- X 20 | = | 11700.00 |
| Short Hand books | 50/- X 25 | = | 1250.00 |
| Field Note books | 25/- X 45 | = | 1125.00 |
| | | | 14075.00 |

8.7 ඇ. අංක 0458, 0460 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, කුලරත්න පාර, සක්වා ප්‍රින්ටර්ස් වෙත රු. 38535/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| Medicine daily charts | 500 X 17.50 | = | 8750.00 |
| Stores Ledgers | 10 X 925 | = | 9250.00 |
| Normal Letter Head Books | 50 X 195 | = | 9750.00 |
| Special Letter Head Books | 15 X 494 | = | 7410.00 |
| 9X4 Envelop | 2000 X 1.65 | = | 3300.00 |
| 3 ½ X 6 Envelop | 100 X .75 | = | 75.00 |
| | | | 38535.00 |

8.8 ඇ. අංක 0445, 0466 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ලිපිද්‍රව්‍ය වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, මහාවීදිය, රෝයල් පොත්හල වෙත රු. 19250/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| චීප් බෝඩ් | 32/- X 250 | - | 8000.00 |
| ඩ්‍රෝවින් පේපර්ස් | 13/- X 500 | - | 6500.00 |
| මැගසින් හෝල්ඩර්ස් | 190/- X 25 | - | 4750.00 |
| | | | 19250.00 |

8.9 කාර්ය නියම කිරීමේ අංක 0280 යටතේ 2013- 04- 01 දින පැවති සිගිති අවුරුදු උළෙල සඳහා උත්සව භාණ්ඩ ලබා ගැනීම වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, පෝරඹ, උපේන්ද්‍ර ඉලෙක්ට්‍රිකල්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 22600/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| ස්ටේජ් | 1 X 15000/- | - | 15000.00 |
| පුටු | 10 X 10/- | - | 100.00 |
| මේස | 10 X 250/- | - | 2500.00 |
| ටෙන්ට් අඩි | 100 X 50/- | - | 5000.00 |
| | | | 22600.00 |

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්**

නගර සභාව සඳහා ස්ටේජ් එකක් සහ ටෙන්ට් එකක් නිර්මාණය කිරීම සුදුසු යැයි ගරු ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී ඒ. ඩබ්. ජගත් කුමාර මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.

8.10 ඇ. අංක 0438, 0445 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද ටයර් වෙනුවෙන් ලේකම්ගේ නිර්දේශය පරිදි අම්බලන්ගොඩ, ගාලු පාර, ආසිරි ටයර් සර්විස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 113780/- ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| 600 X 14 Tyre | 02 X 7650 | - | 15300.00 |
| 500 X 12 Tyre | 02 X 5490 | - | 10980.00 |
| 750 X 16 Tyre | 05 X 17500 | - | 87500.00 |
| | | | 113780.00 |

8.11 ඇ. අංක 0473 යටතේ ගබඩාවට ලබා ගන්නා ලද බීකන් ලාම්පු වෙනුවෙන් කොළඹ 11, ඒෂියන් ඉලෙක්ට්‍රිකල්ස් වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 31500/= ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| බීකන් ලාම්පු (සම්පූර්ණ) | 03 X 10500 | - | 31500.00 |

8.12 ඇ. අංක 0479 යටතේ නිල ඇඳුම් හා පාවහන් හිමි කාර්ය මණ්ඩලය සඳහා අවශ්‍ය පාවහන් වෙනුවෙන් අම්බලන්ගොඩ, ඩී. සැම්සන් ඇන්ඩ් සන්ස් පුද්ගලික සමාගම වෙත ලේකම්ගේ නිර්දේශය පරිදි රු. 46383/21 ක් ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

| | | | |
|---|---|---|---|
| කළු සපත්තු | 25 X 1699/90 | - | 42497.50 |
| කැන්වස් සපත්තු | 01 X 999/90 | - | 999.90 |
| සෙරෙප්පු | 05 X 879/90 | - | 4399.50 |
| මේස් | 26 X 140/- | - | 3140.00 |
| | | | 51536.90 |
| (-) 10% වට්ටම් | | - | 5153.69 |
| | | | 46383.21 |

8.13 නගර සභා බල ප්‍රදේශය තුල ඩෙංගු රෝගය මර්දනය කිරීම සඳහා මහජන සෞඛ්‍ය පරීක්ෂක නිර්දේශය පරිදි 2013 මාර්තු මස ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 13254.20 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමූපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ධූමායන දිනය හා ස්ථානය | ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය(ලී) |
|---|---|---|---|
| 2013-03-01 | 3830 | ඩීසල් | 30 |
| දෙවට හා මහා වීදිය | | පෙට්‍රල් | 06 |
| 2013-03-07 | 3836 | ඩීසල් | 30 |

| | | | |
|---|---|---|---|
| නගර සභා සීමාව තුල | | පෙට්‍රල් | 08 |
| 2013-03-08 | 3842 | ඩීසල් | 30 |
| අම්බලන්ගොඩ දකුණ | | පෙට්‍රල් | 08 |
| ම. සෞ. ප. කොට්ඨාශය | | | |

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්ලිව්. රාහුල ලලිතවික්‍රම මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපිට බැරිද නගරයේ කාණු පිරිසිඳු කිරීම සඳහා කම්පෙෂර් එකක් වගේ එකක් ගෙනිල්ල පිරිසිඳු කරන්න. සමහර තැන්වල ස්ලැබ්වල යට යන්නෙ නෑ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

ඔය ගොඩක් තැන්වල් නගර සභා කාණු නෙමෙයි ගොඩක් තියෙන්නෙ. නමුත් හානිය වෙන්නෙ නගර සභා ප්‍රදේශයේ අයට. මාර්ග සංවර්ධන අධිකාරියේ කාණුවල හරියට බෑවුම නෑ.. ගණකාධිකාරීතුමා අපට බැරිද ඒ කාණුවල පතුල හදන්න මුදල් වියදම් කරන්න. අත්‍යාවශ්‍ය සේවාවක් සේ දක්වල. වැඩ අධිකාරී තුමා ඒ කාණු සඳහා ඇස්තමේන්තුවක් ලබා දෙන්න. කොමසාරිස්තුමාගෙන් විශේෂ අනුමැතියක් අරගනිමු වියදම් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජේ. ඩබ්. ජයන්ත මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මගේ ගෙදර ඉස්සරහ කාණුවේ වතුර බහින්නෙ නෑ. ඉන්න බෑ ගඳ ගහනවා. මගෙන් මිනිස්සු අහනවා. ඔයාගෙ ගෙදර ගාව මෙහෙම නම් අනිත් තැන් කොහොමද කියලා. මගේ ගෙදර පුතාට ඩෙංගු හැදුනා. ගෙදර පොඩි බබාල දෙන්නෙක් ඉන්නවා. මම පොලිසියේ පැමිණිල්ලක් දාන්න හිටියේ. මම දවස් ගානක් කිව්ව මේක කරේ නෑ. මොකක්ද මේ නගර සභාවෙ කටයුතු. අපි හරිම වේදනාවෙන් ඉන්නෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

පී".එච්. අයි මහත්මය මේක ඉක්මන්නටම කරල දාන්න. ඇත්තටම මන්ත්‍රීතුමා ලොකු වේදනාවකින් ඉන්නෙ. ඇස්තමේනතුවක් හදල ඉක්මනින් කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි අපි කියන විදියට කිසි දෙයක් සිදු වෙන්නෙ නැහැ. එක් මන්ත්‍රීවරයෙකුට සේවකයො දෙන්නෙක්වත් දෙන ක්‍රමයක් හදන්න.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කතා කරමින්</u>**

කර්මාන්ත අංශෙ අපේ ඉන්නෙ 25 දෙනයි. ඒ ප්‍රමාණයකින් මේ සියල්ල කරන්න අමාරුයි.

**<u>ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කතා කරමින්</u>**

වැඩ අධිකාරී තුමා මේ සේවකයන්ට දිනකට කරන්න ඕන වැඩ ප්‍රමාණය නියම කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කතා කරමින්</u>**

සභාපතිතුමනි මහා විහාරය පිටු පසින් යන කාණුව හදද්දී බරතල වරදක් කරා. පන්සලේ ඉඩම බේරන්න ඕන නිසා ස්වභාවික කාණුව උඩට ගත්ත. විනාඩි 10 ක් යනකොට වැස්සට යට වෙනවා. ඔය ජයන්ත මහත්මයලාගෙ හරියත් යට වෙන්නෙ එකයි. ඒ කාණුව නිරතුරුවම සුද්ද කරන්න ඕනෙ. කාණුවෙ ගස් පැලවෙලා තියෙන්නෙ.

8.14 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 මාර්තු මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10295.90 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| <u>ඇණවුම් අංකය</u> | <u>ඉන්ධන වර්ගය</u> | <u>ප්‍රමාණය ලීටර්</u> |
|---|---|---|
| 3838 | ඩීසල් | 31 |
| | Engine Oil | 05 |
| 3854 | ඩීසල් | 38 |

8.15 නගර සභාව සතු RA-8796 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 මාර්තු මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 15131.40 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| <u>ඇණවුම් අංකය</u> | <u>ඉන්ධන වර්ගය</u> | <u>ප්‍රමාණය ලීටර්</u> |
|---|---|---|
| 3829 | ඩීසල් | 37 |
| | Engine Oil | 02 |
| 3843 | ඩීසල් | 33 |
| 3861 | ඩීසල් | 33 |
| | කූලන්ට් ඔයිල් | 01 |

8.16 නගර සභාව සතු GL-9369 අංක දරණ ගලි බවුසරය සඳහා 2013 මාර්තු මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 14532.00 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| <u>ඇණවුම් අංකය</u> | <u>ඉන්ධන වර්ගය</u> | <u>ප්‍රමාණය ලීටර්</u> |
|---|---|---|
| 3852 | ඩීසල් | 120 |

8.17 නගර සභාව සතු 49-9422 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 මාර්තු මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 12742.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3837 | ඩීසල් | 43 |
| 3851 | ඩීසල් | 36 |
| 3860 | ඩීසල් | 18 |
| | එන්ජින් ඔයිල් | 01 |
| | පවර් ස්ටියරින් ඔයිල් | 01 |

8.18 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 මාර්තු මස 01-15 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 22403.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3831 | ඩීසල් | 32 |
| 3840 | ඩීසල් | 62 |
| 3846 | ඩීසල් | 33 |
| 3850 | ඩීසල් | 58 |

8.19 නගර සභාව සතු 252 - 0730 අංක දරණ කැබ්රථය සඳහා 2013 මාර්තු මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 17559.50 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3864 | ඩීසල් | 42 |
| 3870 | ඩීසල් | 51 |
| 3882 | ඩීසල් | 52 |

8.20 නගර සභාව සතු RA-3709 අංක දරණ ට්‍රැක්ටරය සඳහා 2013 මාර්තු මස 15-31 දින දක්වා ලබාගත් ඉන්ධන වෙනුවෙන් රු. 10535.70 ක මුදලක් තාක්ෂණ සේවා නිලධාරීගේ හා ලේකම්ගේ නිර්දේශය මත, සී/ස අම්බලන්ගොඩ විවිධ සේවා සමුපකාර සමිතිය වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

| ඇණවුම් අංකය | ඉන්ධන වර්ගය | ප්‍රමාණය ලීටර් |
|---|---|---|
| 3865 | ඩීසල් | 44 |
| 3877 | ඩීසල් | 43 |

8.21 අම්බලන්ගොඩ නගර සභා පුස්තකාල සඳහා 2013 මාර්තු මස ලබාගත් පුවත්පත් වෙනුවෙන් රු. 38840.00 ක මුදලක් ප්‍රජා සංවර්ධන නිලධාරී හා ලේකම්ගේ නිර්දේශය මත, එම්. එස්. වීරසිංහ මහතා වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

8.22 ආර්. පී. මානවඩු මහතා ඔහුගේ දේපල වෙනුවෙන් නගර සභාවට වැඩිපුර ගෙවා ඇති බදු රු. 2117.60 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය මත, ආර්. පී. මානවඩු මහතා වෙත ගෙවීම සඳහා සභා අනුමැතිය ලබා දෙන ලදී.

8.23 2013 - I කාර්තුව සඳහා මුද්දර බදු ලෙස ගෙවිය යුතු රු. 34113.81 ක මුදලක් ලේකම්ගේ නිර්දේශය පරිදි දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8:24 2013 පෙබරවාරි මාසයට අදාල ජල බිල්පත් සඳහා ජාතික ජලසම්පාදන හා ජලාපවහන මණ්ඩලයට ගෙවීම්

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 11453 II | 9636.48 |
| 23453 II | 9970.30 |
| 34453 II | 1006.88 |
| 52453 II | 32082.80 |
| 62453 II | 16040.66 |
| | 68737.12 |

ජල බිල්පත් සඳහා රු. **68737.12** ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:25 2013 පෙබරවාරි මාසයට අදාල විදුලි බිල්පත් සඳහා සී/ස ලංකා විදුලි (පෞද්ගලික) සමාගමට ගෙවීම.

| වැය අංකය | ගෙවූ මුදල |
|---|---|
| 53454 | 18,709.60 |
| 52453 I | 26,788.27 |
| 62453 I | 16,069.28 |
| 34453 I | 4,929.38 |
| 23453 I | 1,426.88 |
| 11453 I | 33,859.14 |
| | **101,782.55** |

විදුලි බිලපත සඳහා රු: **101,782.55**ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8:26 2013 පෙබරවාරි මාසයට අදාල දුරකතන බිලපත සඳහා ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට හා ඩයලොග් ආයතනයට ගෙවීම.

| <u>වැය අංකය</u> | <u>ගෙවූ මුදල</u> |
|---|---|
| 11452 | 31585.92 |
| 12452 | 1163.28 |
| 25451 II | 3075.14 |
| 62452 I | <u>1,163.28</u> |
| | **<u>36987.62</u>** |

දුරකතන බිල්පත සඳහා රු: **36987.62**ක මුදලක් චෙක්පතකින් ලේකම් නිර්දේශයෙන් ගෙවීම.

8.27 සභාපතිතුමා උප සභාපතිතුමා ඇතුලු නාගරික මන්ත්‍රීවරුන් සඳහා 2013 මාර්තු මස ගමන් වියදම් වෙනුවෙන් රු. 30000.00 ක මුදලක් ගණකාධිකාරීගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.28 හිරේවත්ත බුදු පිළිමය අසල නවීකරණය කිරීම වෙනුවෙන් හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත රු. 322710.14 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.29 හිරේවත්ත බුදු පිළිමය අසල නවීකරණය කිරීම වෙනුවෙන් (අතිරේක වැඩ) හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත රු. 208162.18 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.30 ගාලු පාර දොළොස්මහ අසල පොදු නාන ළිඳ නවීකරණය කිරීම වෙනුවෙන් හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත රු. 162203.98 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.31 සිරි නිකේතාරාම පාර පැති බැම්ම ඉදි කිරීම වෙනුවෙන් ගෙවිය යුතු අවසාන ගෙවීම හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත රු. 573398.67 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.32 පෝරඹ දේවාල පාර අතුරු මාර්ගය කොන්ක්‍රීට් කිරීම වෙනුවෙන් ගෙවිය යුතු අවසාන ගෙවීම පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත රු. 459275.49 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.33 හෙප්පුමුල්ල නාන ළිඳ ප්‍රතිසංකරණය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු රැඳවුම් මුදල හෙප්පුමුල්ල කුඩා ගම්මාන සමිතිය වෙත රු. 6102.16 ක මුදලක් වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.34 පොල්වත්ත වරිපනම් අංක 233/1, 233/2 දරණ නිවාස වලට ප්‍රවේශය ලබන මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවිය යුතු අවසාන ගෙවීම වන රු. 282029.37 ක මුදලක් පොල්වත්ත ග්‍රාම සංවර්ධන සමිතිය වෙත වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.35 සිරි නිකේතාරාම පාර ඉතිරි කොටස තාර දැමීම වෙනුවෙන් ගෙවිය යුතු රැඳවුම් ගාස්තුව වන රු. 35944.07 ක මුදලක් ආර්. ඊ. ද සිල්වා මාවත කුඩා ගම්මාන සමිතිය වෙත වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.36 කෙරමිණිය දෙවන හරස් පාර කොන්ක්‍රීට් කිරීම (රත්නාවලී බේකරිය ඉදිරිපස) වෙනුවෙන් ගෙවිය යුතු අවසාන ගෙවීම වන රු. 270038.33 ක මුදලක් කෙරමිණිය කුඩා ගම්මාන සමිතිය වෙත වැඩ අධිකාරී හා ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.37 2013 - I වන කාර්තුව VAT මුදල ලෙස රු. 107443.57 ක මුදල ලේකම්ගේ නිර්දේශය මත දේශීය ආදායම් කොමසාරිස් ජනරාල් වෙත ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

8.38 නගර සභා ක්‍රීඩා පිටිය වෙන් කිරීමට අදාල මුදල් සියල්ල නිදහස් කිරීම වෙනුවෙන් එම මුදල මහා වීදිය අංක 363/01 හි සිරිල් පටුවතවිතාන මහතාට ලේකම්ගේ නිර්දේශය පරිදි ගෙවීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.

## (09) ගිණුම්

**9:1** 2013 මාර්තු මාසයේ වියදම් වාර්තාව, වියදම් වැය විශ්ලේෂණය - පොදු ගිණුම, මුදල් සාරාංශය හා ලැබීම් විග්‍රහය සභාවට ඉදිරිපත් කරන ලදී.

ඒ අනුව 2013 මාර්තු මස ගිණුම් වාර්තා පිළිගතයුතු බව ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතාගේ හා ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතාගේ යෝජනා ස්ථිරත්වයෙන් සභා සම්මත විය.

## (10) ඇස්තමේන්තු

**10.1** අම්බලන්ගොඩ ධීවර වරායේ නව අයිස් කර්මානත ශාලාව සඳහා විදුලි බලය ලබා ගැනීමට මුහුදු වෙරළ පාර පලුදු කිරීම අලුත්වැඩියාව වෙනුවෙන් වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 306031.87 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>**තීරණය**</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.2** ධම්මකුසල මාවත කාණු පද්ධතිය කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 327463.40 ක් වූ සංශෝධිත ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.3** පොකුණ පාර කාණු පද්ධතිය කොටසක් කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 254268.30 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.4** හීගල්දුව මාර්ගය අග කොටසේ ඇති මායිම් තාප්පයේ කොටසක් ඉවත්කර ඉතිරි මාර්ග කොටස සකස් කිරීම සඳහා වැඩ අධිකාරි විසින් සකස් කරන ලද රු. 162106.50 ක් වූ නව ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.5** මහ අම්බලන්ගොඩ පාර වර්පනම් අංක 91/5A දරණ ස්ථානයේ කාණුව කොන්ක්‍රීට් කිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 224676.65 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.6** විලේගොඩ ධම්මානන්ද මාවතේ එක් පැත්තක කාණුව ඉදිකිරීම සඳහා වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 761121.79 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**10.7** ගාලුපාරේ ඇති නගර සභාව සතු ළිඳ අලුත්වැඩියා කිරීම සඳහා (අතිරේක) වැඩ අධිකාරී විසින් සකස් කරන ලද රු. 12882.00 ක් වූ ඇස්තමේන්තුව සභාගත කරන ලදී.

<u>තීරණය</u>

☞ **මෙම ඇස්තමේන්තුව සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**(11)** **වෙනත් කරුණු** නැත

**(12)** **න්‍යාය පත්‍රයට ඇතුලත් නොවූ වෙනත් කරුණු**

**12:1** ' කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය ලබා ගැනීම ' මැයෙන් පොල්වත්ත අග්ගාරාම විහාරස්ථානයේ විහාරාධිපති නින්දානේ වජිරඥාණ මහා ස්ථවිරයන් විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

විහාරස්ථානයේ ඉදි කරනු ලබන වැසිකිළි හතරේ කොන්ක්‍රීට් දැමීම සඳහා නගර සභාව සතු කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය පැය 5 ක කාලයක් සඳහා මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **පොල්වත්ත අග්ගාරාම විහාරස්ථානය සඳහා කොන්ක්‍රීට් මිශ්‍රණ යන්ත්‍රය පැය 5 ක කාලයක් සඳහා මුදල් අය කිරීමකින් තොරව ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:2** ' ප්‍රජාශාලා ගොඩනැගිල්ල පිහිටි බිමෙහි මායිම් දක්වා ජී. අයි. පයිප්ප සිටුවා කොටු දැල් ගසා එම තුන්හුලස් ඉඩම් කොටස ආවරණය කර දෙන ලෙස ඉල්ලීම ' මැයෙන් ඕකන්ද එක්සත් මරණාධාර සමිතිය විසින් එවන ලද ලිපිය සභාගත කරන ලදී.

ඕකන්ද ප්‍රජා ශාලා ගොඩනැගිල්ල සඳහා ගාල්ල ජාතික නිවාස සංවර්ධන අධිකාරිය මගින් ඕකන්ද ළමා ක්‍රීඩාංගණයට දකුණු පසින් පිහිටි තුන්හුලස් බිම් කැබැල්ල ලබා දී ඇති අතර දැනට එම ගොඩනැගිල්ල විවිධ කාර්යන් සඳහා පාවිච්චි කරනු ලබන බවත් මෙම ගොඩනැගිල්ලේ සහ අදාල භාණ්ඩ වල ආරක්ෂාව සඳහා මෙම තුන්හුලස් බිම් කොටසේ මායිම් දක්වා ජී. අයි. පයිප්ප සිටුවා කොටු දැල් ගසා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☛ **මේ සඳහා වැඩ අධිකාරී මහතාගෙන් ඇස්තමේන්තුවක් ලබා ගැනීමට සභාව තීරණය කරන ලදී.**

**12:3** ' රූපවාහිනී යන්ත්‍රයක් ලබා ගැනීම සඳහා ' මැයෙන් නගර සභාවේ පණිවුඩකරු නලින් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

කාර්යාලයේ ඇති රූපවාහිනී යන්ත්‍රය පිලිස්සී ඇති බවත් එම නිසා අලුතින් එල්. ඊ. ඩී. (LED) රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගැනීමට අනුමැතිය ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **කාර්යාලය සඳහා අලුතින් එල්. ඊ. ඩී. (LED) රූපවාහිනී යන්ත්‍රයක් මිලදී ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:4** **‘ (වෙබ්)** WEB කැමරා දෙකක් ලබා ගැනීම **’** මැයෙන් නගර සභාවේ පණිවුඩකරු නලින් මහතා විසින් ඉදිරිපත් කර තිබූ ලිපිය සභාගත කරන ලදී.

නගර සභාවේ මාසික සභා රැස්වීම් අන්තර්ජාලයට එක් කිරීම ගරු සභාපතිතුමාගේ අදහස බවත් මේ සඳහා ඉතා උසස් වර්ගයේ කැමරා පද්ධතියක් හෝ කැමරා දෙකක්වත් අවශ්‍ය බවත් එය ඉටු කර දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **නගර සභාව සඳහා අවශ්‍ය වෙබ් (**WEB**) කැමරා දෙකක් ලබා ගැනීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:5** **‘** හිරේවත්ත බුදු පිළිමය අසල භූමි භාගයේ නඩත්තු කාර්යය පැවරීම **’** මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කරන ලද ලිපිය සභාගත කරන ලදී.

හිරේවත්ත බුදු පිළිමය අසල භූමි භාගය නවීකරණ කටයුතු කිරීමෙන් පසුව එම ස්ථානයේ ජල බිල්පත් විදුලි බිල්පත් ගෙවීමත් එම ස්ථානය නඩත්තු කිරීමත් ලංකා ටයිල්ස් පීඑල්සී සමාගම වෙත පැවරීමට ගරු සභාපතිතුමාගේ උපදෙස් මත එම ආයතනයට දන්වා යැවූ බව දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:6** **‘** දකුණු පළාතේ පළාත් පාලන ආයතන වල වාහන සඳහා නිදහස් ආදායම් බලපත්‍ර ලබාගැනීම **’** මැයෙන් තංගල්ල නගර සභාවේ ගරු සභාපතිතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙත යවන ලද ලිපියේ පිටපත සභාගත කරන ලදී.

දකුණු පළාතේ පළාත් පාලන ආයන සතු වාහන සඳහා නිදහස් ආදායම් බලපත්‍ර ලබා ගැනීම සඳහා දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යාංශය වෙත කරන ලද ඉල්ලීමක් සඳහා ගත් ක්‍රියාමාර්ග පිළිබඳව ගරු දකුණු පළාත් ප්‍රධාන අමාත්‍යතුමාගේ අවධානය යොමු කර නිදහස් ආදායම් බලපත්‍ර ලබා ගැනීමේ කාර්යය ඉටුකර ගැනීමට අම්බලන්ගොඩ නගර සභාව සතු වාහන සඳහාද එම අවස්ථාව ලබා ගැනීමට ඉල්ලීමක් කරන ලෙස දන්වා තිබුණි.

<u>තීරණය</u>

☞ **අම්බලන්ගොඩ නගර සභාව සතු වාහන සඳහා නිදහස් ආදායම් බලපත්‍ර ලබා ගැනීමට ඉල්ලීම් කිරීමට ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා විසින් යෝජනා කල අතර ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සභා සම්මත විය.**

**12:7** ‘ මාර්ග ලේඛනය - අම්බලන්ගොඩ නගර සභාව’ මැයෙන් විෂය ලිපිකරු විසින් ඉදිරිපත් කර තිබු ලිපිගොනුව සභාගත කරන ලදී.

මාර්ග නාම පුවරුවල වෙනස් විය යුතු හා අලුතින් එකතු විය යුතු මාර්ග නාම ලේඛනය ඉදිරිපත් කර තිබුණි.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

ගැසට් කරපු නැති පාරවල් නම් කරන්න බැහැ.

<u>තීරණය</u>

☞ **මෙම මාර්ග නාම ලේඛනයේ නිවැරදි විය යුතු නම් නිවැරදි කර ඉදිරි කටයුතු සිදු කිරීමට සභාව තීරණය කරන ලදී.**

**12:8** ‘ දම් අමා වෙසක් කලාපය ’ මැයෙන් අම්බලන්ගොඩ සිරිනිකේතාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

විහාරස්ථානයේ තිසරණ සහන පදනම මගින් වෙසක් පොහොය නිමිත්තෙන් වෙසක් කලාපයක් පැවැත්වීමට කටයුතු සුදානම් කර ඇති බවත් ඊට අදාල දැන්වීම් පුවරු දෙකක් නගරසභා බල ප්‍රදේශය තුල ප්‍රදර්ශනය කිරීම සඳහා ගාස්තු අය කිරීමකින් තොරව අවසර ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **සිරිනිකේතාරාම විරාරස්ථානයේ දැන්වීම් පුවරු දෙකක් ගාස්තු අය කිරීමකින් තොරව ප්‍රදර්ශනය කිරීම සඳහා සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:9** ‘ අලුත් අවුරුදු ක්‍රීඩා උත්සවය හා සංගීත ප්‍රසංගය ’ මැයෙන් අම්බලන්ගොඩ පෝරඹ ස්ටාර් ක්‍රීඩා සමාජයේ සංධායක මහතා විසින් එවා තිබු ලිපිය සභාගත කරන ලදී.

ක්‍රීඩා සමාජය මගින් පවත්වනු ලබන අවුරුදු උත්සවය 2013- 04- 19 දින පැවැත්වෙන බවත් ඒ සඳහා අවශ්‍ය ජාතික කොඩි සහ කණු 30 බැගින්ද පුටු 250 ක් ද නොමිලයේ ලබා දෙන ලෙසත් ඉල්ලා තිබුණි.

<u>තීරණය</u>

☞ **2013- 04- 19 දින පැවැත්වෙන අවුරුදු උත්සවය සඳහා ජාතික කොඩි සහ කණු 30 බැගින්ද පුටු 250 ක් ද නොමිලයේ ලබා දීමට සභා අනුමැතියට යටත්ව අවසර ලබා දීම වෙනුවෙන් සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:10** ‘ පුණ්‍යානුමෝදනාවයි ’ මැයෙන් අම්බලන්ගොඩ සිරිනිකේතාරාම විහාරස්ථානයේ විහාරාධිපති හිමියන් විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

අප විහාරස්ථානයේ තාප්පය ඉදිකිරීම නිසා පැවති විශාල අඩුවක් පිරිමැසුන බවත් ඒ වෙනුවෙන් ගරු සභාපතිතුමා ඇතුලු මන්ත්‍රී මඩුල්ලටත් කාර්ය මණ්ඩලයටත් ස්තුතිය පිරිනමන බව දන්වා තිබුණි.

<u>**තීරණය**</u>

☛ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

**12:11** ‘ විද්‍යාලයීය ත්‍යාග හා වර්ණ ප්‍රදාන උත්සවය සඳහා අවශ්‍ය කොඩිකණු / සිංහ කොඩි හා අමුත්තන් සඳහා පුටු ලබා ගැනීම සඳහා ’ මැයෙන් ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ විදුහල්පතිතුමා විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

විද්‍යාලයීය 2013 වර්ෂයේ ත්‍යාග හා වර්ණ ප්‍රදානෝත්සවය වෙනුවෙන් කොඩි කණු 20 ක් ද සිංහ කොඩි 20 ක් ද පුටු 20 ක්ද මුදල් අය කිරීමකින් තොරව ලබා දෙන ලෙස ඉල්ලා තිබුණි.

<u>**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි ලිපිය ඉදිරිපත් කරල තියෙන්නෙ විදුහල්පතිතුමාද.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

ඔව් විදුහල්පතිතුමා තමයි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි අපි විදුහල්පතිතුමා හමුවෙන්න ගියේ ප්‍රශ්නයක් සාකච්ඡා කරන්න මහත්මා විදියට ළමයි ටික ඇතුලත් කර ගන්න. එහෙම කරාට ගෞරවයක් තිබ්බෙ නැහැනෙ. අපිට කැළෑ පත්තර එව්වනෙ. අපි නගරයෙ ළමයි වෙනුවෙන් කතා කරන්න ගිහිල්ල මන්ත්‍රීවරු හෑල්ලුවට ලක් වුනා. ඒ නිසා මෙවැනි ඉල්ලීම් වලට අනුමැතිය ලබා දෙන කොට දෙපාරක් හිතා බලන්න කියල මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

<u>**තීරණය**</u>

☛ **ගා/ශ්‍රී දේවානන්ද විද්‍යාලයේ ත්‍යාග හා වර්ණ ප්‍රදාන උත්සවය සඳහා කොඩි කණු 20 ක් ද සිංහ කොඩි 20 ක් ද පුටු 20 ක් ද නොමිලයේ ලබා දීමට සභාවේ අනුමැතිය ලබා දෙන ලදී.**

**12:12** ‘ දම්සෝ මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය 2013- 03- 27 සිට 2013- 03- 31 ’ මැයෙන් ධර්මාශෝක විද්‍යාලයීය ආදි ශිෂ්‍ය සංගමය විසින් එවා තිබූ ලිපිය සභාගත කරන ලදී.

ධර්මාශෝක විද්‍යාලය මගින් සංධානය කල දම්සෝ මේලා වෙළඳ ප්‍රදර්ශනය හා සැණකෙළිය සාර්ථක කර ගැනීම සඳහා ලබා දුන් සහයෝගයට ස්තුතිය පුදකර තිබුණි.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි මින් පසුව අපේ අනන්‍යතාවය වෙනුවෙන් අපි සභාපතිතුමත් එක්ක විතරයි කතා කරන්නෙ. අපේ නායකතුමා මේ නගරයේ තියෙන විද්‍යාලයට එනකොට අපට ආරාධනාපත් නෑ. තමුන්නාන්සේ කතා කරල තමයි ඒක ලබා ගත්තෙ. එවැනි තත්වයක් ඇති කරන්න එපා සභාපතිතුමා.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

ජනාධිපති ආරක්ෂක අංශයට කතා කරපු වෙලාවෙ නම් කිව්වෙ පාසලෙන් දීපු ලැයිස්තුවටයි ආරාධනා කරේ කියලා.

<u>**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි මින් පසුව මන්ත්‍රීවරුන් වෙනුවෙන් ඒ ආයතන වලින් ඉල්ලීම් කරන්න එපා. එහෙම වුනොත් අපි හෑල්ලුවට ලක් වෙනවා. අපි මහජනතාවගේ ඡන්දෙන් පත්වෙලා ඇවිල්ල ඉන්නෙ. අපි වෙනුවෙන් තමුන්නාන්සේ කතා කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙනවා. නමුත් මිනු ඉදිරියට එහෙම කතා කරන්න එපා කියල මම ඉල්ලා සිටිනවා.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි එතනදි ජනාධිපති ආරක්ෂක අංශයේ ක්‍රියා කලාපය ගැන අපට වාද කරන්න බෑ. ඒ අය කිව්වට පස්සෙ හිටපු විදුහල්පතිවරුන්ටවත් එන්න අවසර නෑ. ආදිශිෂ්‍ය සංගමයට දෙකයි නියෝජනය.

<u>**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**</u>

මට හිතා ගන්න බෑ ධර්මාශෝක විද්‍යාලය විතරක් එවැනි ප්‍රතිපත්තියක් අනුගමනය කරේ ඇයිද කියලා. ජනාධිපතිතුමාගේ කාර්ය මණ්ඩලයෙන් එහෙම සීමාවක් නෑ. අනික් තිබුන උත්සව සියල්ලම සාමාන්‍ය ජනතාවට විවෘතව තිබුණා. ධර්මාශෝකෙට විතරක් ශේෂයක් ඇයි කියල මට හිතා ගන්න බෑ.

<u>**ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**</u>

සභාපතිතුමනි මෙතන එතරම් කාල පරාසයක් තිබුණෙ නෑ. ප්‍රධාන උත්සව ගණනාවකට සහභාගි වෙන ගමන් අතරමගදි පැය භාගයක් තමයි තිබුණෙ.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

මම එදා දවසෙම ජනාධිපතිතුමා ගිහිපු හැම තැනටම ගියා. මහපාරෙ හිටපු මිනිස්සු ගාව නවත්ත නවත්ත කතා කරා. ආරක්ෂාව පිළිබඳව එතුමාගෙ තැකීමක් තිබුනෙ නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ජී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

ඒක ජනාධිපතිතුමාගෙ අයිතියනෙ. මෙතන පී. එස්. ඩී. එකේනෙ වගකීම. මෙතන තිබුණ කාල සීමාව අඩු නිසා තමයි පිරිස සීමා කරෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපිට ආරාධනාවක් ආවා. අපි ගියා. නමුත් පී. එස්. ඩී. එකෙන් ඔහොම කියනවද කියන එක මම දන්නෑ. කිව්වනම් ඒ අයත් වැරදියි. හැබැයි ඉස්කෝලෙන් අපිට දීපු මේවෙක නම් සතුටුදායක නෑ. අපි මොනව කිව්වත් මේ විද්‍යාලෙට සලකනවා. නමුත් එදා අපි යනකොට උප සභාපතිතුමා පිටිපස්සෙ. කවුරු කරත් එවගේ තත්වෙකටනම් අපි කැමති නෑ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි අපේ විද්‍යාලය හැටියට ධර්මාශෝක විද්‍යායට අපි සලකනවා. නමුත් පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරුන් හැටියට අපට අනන්‍යතාවක් තියෙන්න ඕනෙ. මේක අපේ ඡන්ද දායකයන්ටත් කරන අගෞරවයක්. අපිට ලබා දීපු ස්ථාන පිළිබඳව අපි අපහසුතාවයට පත් වුනා. පසුව අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඇහුව ඔබතුමාල ආවද කියල. මට උගන්නපු ගරුවරු මගේ ඉදිරිපිට හිටියා. ගුරුවරියක් මට කිව්ව එතෙන්ට එන්න කියල. මම එතුමියට කරන සැලකිල්ලක් විදියට මම ඒක කරෙ නෑ. ඒ විශ්‍රාමික ගුරුවරයක්. එතුමියටත් තේරුණා. එවගේම සියවස් සැමරුමේදී අපේ මන්ත්‍රීතුමා අපිට නිසි විදියට ඒ කටයුතු කරා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ධර්මාශෝකෙ ආදි ශිෂ්‍යයන් හැටියට පෞද්ගලිකව අපට ආරාධනා කරොත් යාම අපේ යුතුකමක්. අපිට ලිපියක් ආව සභා වාර්තාවත් එක්ක මැයි 02 වෙනිදා. ඒ ලිපිය අපේ නමට එවන්න පාසලෙන් උත්සාහයක් දරල තියෙනවා. අපි නොයෑම තුල පාසලේ මතය වෙන්නෙ නොසලකා හැරිය කියලයි. මේ ලිපියෙ සඳහන් කරල තියෙනව මැයි 01 දින 12 ට පෙර විදුහල්පතිට දන්වන්න කියලා.

**<u>ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

එකට හේතු වුනේ 01 වෙනිදත් පහුවෙලා තමයි අපට ඔයගොල්ලන්ට බෙදන්න කියල ලියුම් ලැබුනේ.

**ගරු නගර සභා මන්ත්‍රී බී. ජනිත් වික්‍රමතිලක මහතා කථා කරමින්,**

මෙතනදි හිතන්නෙ අපි ඇල්ල නැත්තෙ ජනාධිපතිතුමා එන හින්ද කියලයි. අපි සියවස් සැමරුම් ප්‍රධාන උත්සවයේදී ප්‍රධාන අමාත්‍යතුමාත් සමග සහභාගි වුණා. ඒ නිසා මෙයටත් අපි සහභාගි වෙනවා. මහජනයා වෙනුවෙන් පත් කරපු නියෝජිතයන් 12 දෙනාට යම් ස්ථානයක් නොමැති නම් අපි එතෙන්ට යාමත් ගැටලුවක්. ඇත්තටම අපි පාසල නොසලකා හැරියා නෙමෙයි නිසි විදියට ආරාධනා ලැබුන නම් අපි එකට සහභාගි වෙනවා. අපිට සහභාගී වීමට නොහැකි වීම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරනවා සභාපතිතුමනි.

**ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,**

සභාපතිතුමනි මැයි පෙළපාලිය දවසෙ තමයි ජනාධිපතිතුමාගෙ සම්බන්ධීකරණ රැස්වීම තිබ්බෙ. එතකොට මම නෑ. එතෙන්දි ගත්තු තීරණ තමයි මේ. මම විදුහල්පතිතුමාට කතා කරා මේක වැරදියි කියලා. ඊට පස්සෙ තමයි නැවත පී. එස්. ඩී. එකට කතා කරල කලබලයට ලියුම ගැහුවෙ. ඒ වෙනකොටත් ආසන වෙන් කරල ඉවරයි. මන්ත්‍රීවරුන්ට ආසන ටික වෙන්කරල දුන්නෙ මම. මේ තත්වය ලියන්න ඔබතුමා අප්‍රසාදය පල කරල පාසලට.

**ගරු සභාපති ඇම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

මම වගකීමෙන් කියනව පී. එස්. ඩී. එකෙන් එහෙම දෙයක් වුනේ නැහැ. මම එතුමාත් එක්ක හැම තැනටම ගියා. බලපිටියෙදි මන්ත්‍රීවරු කට්ටියත් එක්ක පායාරුපයකුත් ගත්තා. ඊලගට ඇල්පිටියෙදි එතුමා සියලුම ජනතාවත් එක්ක සුහදශීලිව කතා කරා. මේ තත්වය වුනේ ධර්මාශෝක විද්‍යාලයෙන්ම පමනයි. විශේෂයෙන්ම පී. එස්. ඩී. එකට අප්‍රසාදය පල කිරීම වැරදියි. ඒ අය නිසයි අපේ ජනාධිපතිතුමා ආරක්ෂා වෙන්නෙ. මන්ත්‍රීවරු ඒ විදිය ප්‍රකාශ කරන්න එපා. අනිත් එක අපට යුතුකමක් තියෙනවා අපේ නායකතුමා නගරයට එද්දි සාමාන්‍ය ජනතාවට බලන්න ඕන්නම් අවසර දෙන්න. ඒ තත්වය ඇල්පිටියෙත් තිබුණ. බලපිටියෙත් තිබුණ.

**තීරණය**

☞ **මෙම ලිපිය සභාවේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරන ලදී.**

## ✪ වෙනත් කරුණු

**ගරු උප සභාපති කමල් වැල්ලගේ මහතා කථා කරමින්,**

සභාපතිතුමනි අපේ ලේකම්තුමා ස්ථාන පරීක්ෂණයකට ගිහිල්ල තියෙනවා 2012-11-01 වෙනිදා. 2012-11-02 වෙනිදා ලිපියක් මගින් දැනුම් දීල තියෙනව ටෙක්ලා ගංගා කුමාරි කියන මහත්මියට. මේක දැන් ස්ථාන පරීක්ෂණයට ගිහිල්ලත් මාස 06 ක් වෙනවා. මේක මේ සිද්ධිය වුන මහත්මයට ලොකු අසාධාරණයක්. මම අදත් කාර්මික නිලධාරිණියක් ඇරියා. මේ දීපු උපදෙස් තාම පිලිපැදල නැහැලු.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

මේක අපි මාස ගානක් කතා කරා. මේකෙ තත්වය බලල ඒ අවශ්‍ය කාරණාව ඉටු කරල දෙන්න. ලබන සතිය ඇතුලතම මේක කරල දාන්න. සභාපතිතුමනි මේක  මේ නිලධාරීන් කරන්නෙ නැත්නම් ඔබතුමා ඒ ගැන තීරණයක් ගන්න.

**ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,**

මේ ලයනල් මහත්මය මේ ආයතනයේ වැඩ කරපු කෙනෙක්. එවගේම මේ අදාල දේපල දරුවන් වෙනුවෙන් රජයට දීපු කෙනෙක්. ඔයා කියන දේ කරන්නෙ නැත්නම් නඩුවක් දාන්න. උසාවියෙන් බේරගන්න කියලා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි ලිපියක් ලැබිල තියෙනවා ඒ. කේ. එස්. දයාන් මනරංජිත් ද සිල්වා මහතා විසින් ඉදිරිපත් කරපු. කලුවඩුමල්ල මාර්ග සති පාර තැනීමේදී සිදුවී ඇති අසාධාරණය සම්බන්ධවයි කියලා.

**ගරු උප සභාපති කමල් වැල්ලගේ  මහතා කථා කරමින්,**

එකෙ අසාධාරණය වෙලා තියෙන්නෙ පාරෙ යන අයට සභාපතිතුමනි. ඒ නිසා ඔය ලිපිය කියවන්න එපා.

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

මේක අපි අමාරුවෙන් හැදුව. ඊට පස්සෙ අල්ලල වැට ගහල තියෙනවා. මිට කලිනුත් වැට ඉවත් කරන්න කියල තියෙනවා. තාම එක කෙරිල නැ. සභාපතිතුමනි මම ඊලග සභාවෙදි යෝජනාවක් ගේනව වැට ඉවත් කරන්නෙ නැත්තම් මේ කොටස විතරක් පවරගන්න කියල යෝජනාවක් ගේනවා. දිනයක් දීල එක දැනුම් දෙන්න.

**ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,**

පවරා ගැනීමේ යෝජනාව ඉවත් කරල නෑ. ඒ යෝජනාවෙ තියෙන්නෙ අඩි 20 කින් පළල් කිරීම. දැනට අඩි 12 කට පළල් කරල තියෙනවා. ඔයම හතාගේ තැන විතරක් අඩි 3 ක් අල්ලල තියෙනවා. එක පැහැදිලි අවහිරතාවයක් සියලු දෙනාහට. දැනට තියෙන යෝජනාව ක්‍රියාත්මක කරන්න කියල ලියුමක් යවන්න විතරයි තියෙන්නෙ.

**ගරු නගර සභා මන්ත්‍රී ඒ. ජී. ලක්ෂමි හේමන්තා ද සිල්වා මෙනවිය කථා කරමින්,**

සභාපතිතුමනි අර තාර දාපු පාරෙ ඉතුරු ටික ඉන්ටර් බ්ලොක්ස් ගල් අල්ලන්න හිතන් ඉන්නවා. මම එක නම් කරල යවන්නම් .

**ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,**

සභාපතිතුමනි හල්වතුරෙ කුණු දැම්ම සම්බන්ධව වහින නිසා ගැටලු ඇතිවෙලා තියෙනවා. රත්ගම ව්‍යාපෘතිය සම්බන්ධව ක්‍රියාත්මක වෙන්නෙ නැද්ද. එකට අපි වැඩසටහනක් හැදුවෙ නැහැනෙ. මෙතන ගැටලුවක් ඇති වුනොත් මොකද වෙන්නෙ.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

රත්ගමට යවන තෝරා නොගත්ත කුණු සඳහා අපි ගෙවන්න ඕනෙ රු. 1000 ක්. තෝරා ගත්ත ඒව තියෙනව නම් 500 ක් ගෙවන්න ඕනෙ.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

ඒක තමයි සභාපතිතුමනි අපි බෑග් ටිකක් දීල තෝරලම දෙන්න කිව්වොත් මිනිස්සු ඒකට කැමතියි. ඒක නිසා මේකට ක්‍රම වේදයක් හදල දෙන්න. ඒවගේම පොල්වත්ත සුසාන භූමිය පාර පුලුල් කරන්නත් ඒමිනිස්සු කැමතියි. මේක කතා වෙනව වගේම ක්‍රියාත්මක වෙන්නත් ඕනෙ. කන්දෙගොඩ මායිමේ කාපට් නවත්තල තියෙන්නෙ. පින්දුව තැනත් නවත්තල තියෙන්නෙ. මේක ප්‍රධාන මාර්ගයක් හැටියට සලකා කාපට් කිරීම තමයි අවශ්‍ය වෙන්නෙ. එතකම් වතුර පිරෙන තැනක් තියෙනවා. එතන ප්‍රිමික්ස් ටිකක් හරි දාන්න.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරී මහතා විහාරගොඩ පාර ප්‍රතිසංස්කරණය කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එම්. ඩබ්. රාහුල ලලිතවික්‍රම මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමා කුලරත්න විද්‍යාලයේ බැම්ම ඉක්මන් කරල කරන්න. කාණුව නැතුව තාප්පයක් හරි කඩාගෙන වැටුනොත් ප්‍රශ්නයක්.

**<u>ගරු නගර සභා මන්ත්‍රී එච්. එල්. අනුර කිත්සිරි මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මහ අම්බලන්ගොඩ ප්‍රදේශයේ වරිපනම් කොට්ඨාශය සමහර ඒවගෙ පනියන්දූව කියල වැටෙන්නෙ. ඒක දරුවන් පාසල් වලට ඇතුලත් කිරීමේදී බලපානවා.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි මිට සභා වාර දෙකකට විතර ප්‍රථම මම අම්බලන්ගොඩ සුසානභූමියේ වහලදිරාපත් වීම ගැන මෙහි සඳහන් කරා. නමුත් තාම ඒ වහලෙ උළු තියල නෑ. මේ වෙනකොට වහලේ ලී දිරල යන තත්වෙට පත්වෙලා.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරී මහතා ලංකාවෙ කොහේහරි තියෙන තැනකින් බලල මේ උළු අරගෙන එන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි එතකන් තහඩුවකින් හරි වහල දාන්න. ඒවගේම සභාපතිතුමනි ආදාහනාගාරයේ දුම් කවුලුව ඒක ඇණයකින් තියෙන්නෙ. මරණයක් ආදාහනය කරන වෙලාවට යන දුම පහලට බහින්නෙ. ඒවගේම සුසාන භූමියේ තියෙන ඒක ටොයිලට් එහෙකින් අවුරුද්දක විතර ඉඳන් වතුර යනවා. ඒවගේම හරිම අපිරිසිඳුයි.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරී මහතා  ඒක බලල තාවකාලික විසඳුමක් හරි කරන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒවගේම පෝරඹ වලව්ව පාරෙ බෝක්කුව වැහිලා. වහින වෙලාවට පාර යටවෙන තත්වයක් තියෙන්නෙ.

**<u>ගරු සභාපති එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප් මහතා කථා කරමින්,</u>**

වැඩ අධිකාරී මහතා  වලව්වෙ පාරෙ බෝක්කුව බැඳල දෙටු පුරවැසි පියස ලඟින් තමයි වතුර පාර යන්නෙ. එතනින් ගිහිල්ල ඇලට වැටෙන විදියට කානුවක් බඳින්න ඇස්තමේන්තුවක් දෙන්න.

**<u>ගරු නගර සභා මන්ත්‍රී පී. සරත් ශ්‍රීලාල් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ආදාහනාගාර ගැන කතා කරද්දි කියන්න ඕනෙ ඒ සේවකයන් දෙන්න රක්ෂණය කරන්න. අවධානමක් තියෙනවා. ඒවගේම ක්‍රීඩා කමිටුවෙදි ඉල්ලීමක් තිබුන ධාවන පථය අදින කොට යටට පෙට්ස් දාන්න කියල මායිම්. මේක මාස තුනෙන් තුනට මැකෙනවනෙ. ඒ ගමන්ම මේකෙ ලෙවල්ස් චෙක් කරන්නත් කියන්න. ඒවගේම මේ ක්‍රීඩා පිටිය ප්‍රතිසංස්කරණයක් කරන්න අපි උනන්දු වෙන්න ඕනෙ. පියවරෙන් පියවර හරි යන්න ප්‍රතිපාදන සොයා ගන්න බලමු.

**<u>ගරු නගර සභා මන්ත්‍රී ආර්. පී. දේව් රොහාන් ද සිල්වා මහතා කථා කරමින්,</u>**

සභාපතිතුමනි ඒවගේම සුසාන භූමියේ තියෙන එක ටොයිලට් එහෙකින් අවුරුද්දක විතර ඉඳන් වතුර යනවා. ඒවගේම හරිම අපිරිසිදුයි.

**ප. ව. 01.00 ට පමණ සභාවේ වැඩ කටයුතු අවසන් කරන ලදී.**

ඩී. වී. සුනිල්,
ලේකම්,
අම්බලන්ගොඩ නගර සභාව.

එම්. ඩබ්ලිව්. අරුණ ප්‍රදීප්,
සභාපති,
අම්බලන්ගොඩ නගර සභාව.

**2013 – 05 – 23** දින,
**අම්බලන්ගොඩ නගර සභා කාර්යාලයේදීය.**